# සිහිනයක්ද ඔබේ ආදරේ



1

ඉස්කෝලේ  ගිහිල්ලා හවස ටියුෂන් පන්තියටත් ගිහිල්ලා දැනුයි බෝඩිමට ආවෙ ආපු ගමන්ම මගේ හොඳම යාලුවා අරුණි ගියා දයසේ ඕපදූප ටික හොයාගෙන එන්න එයා හැමදාම බෝඩිමට ආපු ගමන්ම කරන්නේ අපි නැති අතරේ සිද්ධ වුන වැදගත් දෙයක් තියෙනවද කියලා හොයලා බලන එක.

එයා ගියාට පස්සේ මම මූණ හෝදගෙන පොත අතට ගත්තේ පාඩම් කරන්න. මොකද උසස් පෙල විභහගේ ලියන්න තියෙන්නේ තව මාසයයිනේ.පාඩම් කරන්න හිතාගෙන පොත අතට ගත්තත් පාඩම් කරන්න තරම් හිත එක තැනක නැහැ.මගේ හිතට මහ අමුතු හැඟීමක් දැනෙනවා හරියට මම කාලයක් තිස්සේ හොය හොය හිටපු කෙනෙක් හම්බුනා වගේ හැගිමක්.

ඒක මහ අමුතු හැඟීමක්.මොකද මම කාවවත් හොය හොය හිටියෙත් නැහැ ඒ වගේම අලුතෙන් කවුරුවත් මගේ ජීවිතේට ආවෙත් නැහැ

ඉතින් මම පොත පැත්තකින් තියලා කල්පනා කරන්න පටන් ගත්තා. මට මොකද මේ වෙලා තියෙන්නේ කියලාඔය අතරේ අරුණි දවසේ ඕපදූප ටික හොයාගෙන ඉවර වෙලා මම හාටපු තැනට ආවා

“ඉවරද දවාසේ ඕපදූප ටික හොයලා එහෙනම් දැන්වත් ඇවිත් පොතක් අරන් පාඩම් කරනවා”.මම අරුණිට කිව්වා

“ මට කියන්නේ ඔයත් ඔය පාඩම් කරනවා නෙවෙයිනේ අනූ,මොකද පොත දිහා බලන් කල්පනා කරන්නේ.”අරුණි මගෙන් ඇහුවා.

“ මට මහ අමුතු හැගීමක් දැනෙනවා.මට දැනෙන්නේ හරියට මම හොය හොය හිටපු කෙනෙක්ව හම්බුනා වගේ හැගීමක්.ඒක මහ අමුතු දෙයක්.”මම කිව්වා

“ කොල්ලෙක් නැති ඔයා අනිවාර්යෙන්ම හොයන්න ඇත්තේ කොල්ලෙක්ම තමා”.අරුණි හිනාවෙන ගමන් කිව්වා

“ ඒ ඔයානේ අරුණි දැන්වත් ඔය පිස්සුව නවත්තලා පාඩම් කරනවා.තව මාසයයි නේද තියෙත්නේ.”මම අරුණිට කිව්වා

“අයියෝ තව පොඩ්ඩෙන් හොදම කතාව කියන්න මට අමතක වෙනවා. ඉස්සරහ තියෙන කොල්ලන්ගේ බෝඩිමට අලුතෙන් කොල්ලෙක් ඇවිල්ලා.”අරුණි කිව්වා

“ඉතින් මට මොකද” මම ඒ කතාව වැඩිය ගනන් ගන්නැතුව කිව්වා

“ඔව් ඉතින් ඔයාට ඒ ගැන කියලා වැඩක් නෑනේ! කොල්ලෙක් ගැන හිතන කෙනෙක්ටනේ මේවා කියන්න ඕනෙ.” අරුණි කිව්වා

“ අනේ මේ අරුණි එක්කෝ  පොතක් අරන් ඇවිත් පාඩම් කරන්න.නැත්නම් මට පාඩම් කරන්න දෙන්න.”මම තරහින් කිව්වා

ඊට පස්සේ අරුණි ගිහින් පොතක් අරන් ඇවිල්ලා මගේ ළග තිබුණ අනිත් පුටුවෙන් ඉදගත්තා

“මේ අනූ අර කොල්ලා කොයි වගේද දන්නැහැ.නේද අපරාදේ අපි හිටියේ නැහැනේ.” අරුණි කිව්වා

“ ඇත්තටම අරුණි ඔයාට කොල්ලෝ ගැන ඇරෙන්න කතා කරන්න වෙන මාතෘකාවක් ඇත්තෙම නැද්ද?” මම ඇහුවා

“ මොකද නැත්තේ මට ඕනේ තරම් මාතෘකා තියෙනවා කතා කරන්න.” අරුණි කිව්වා

“එහෙනම් ඉතින් වෙන මොනව හරි ගැන කතා කරන්නකෝ.” මම කිව්වා

“ ඇත්තටම අනූ අපි දෙන්නට මේ පාරවත් ප්‍රයිස් ගිවින්ග් එකේ නිවේදනේ කරන්න හම්බුවෙයිද දන්නැහැ නේද ?”අරුණි ඇහුවා

“මේ පාර අපි දෙන්නට අනිවාර්යෙන්ම හම්බුවෙයි.හැබැයි එහෙම වුනොත් අපිට විහගේ ඉවර වෙලත් මෙහේ ඉන්න වෙනවා.” මම කිව්වා

“ඒක හොදයිනේ එතකොට අර අලුත් කොල්ලා ගැන තව විස්තර ටිකක් හොයාගන්න පුලුවන්නෙ.” අරුණි කිව්වා

“ ඔයාටනම් කියලා වැඩක් නැහැ අරුණි.කොහෙන් ගියත් ඔයා කතාව නතර කරන්නේ කොල්ලෙක්ගෙන්.” මම ඉදගෙන හිටපු තැනින් නැගිටින ගමන් කිව්වා “මම යනවා නිදාගන්න.මට අද පාඩම් කරන්න බැහැ වගේ.”

“වහියිද දන්නැහැ අද මෙයා පාඩම් කරන්නැතුව නිදාගෙන.”අරුණි විහිලුවට වගේ කිව්වා.

“ඇයි අද ඔයා නිදාගන්නැද්ද?වෙනදට ඔයා මේ වෙනකොට නිදිනේ.” මම ඇහුවා.

“මම අද නිදාගන්නේ අලුත් කොල්ලා කොයි වගේද කියලා හොයාගෙනම තමයි.”අරුණි කිව්වා.

“එහෙනම් ඉතින් ඕනේ දෙයක් කරගන්නවා.”එහෙම කියලා මම කාමරේට ගියා.ඇඳට ගියපු ගමන්ම වගේ මට නින්ද ගියා.අරුණි කොයි වෙලේ නිදාගන්න ආවද දන්නේ නැහැ. ඒත් මට රෑ මහ අමුතු හීනයක් දැකලා ඇහැරුනා.ඊට පස්සේ මට නින්ද ගියේම නැහැ.

ඒ නිසා මම උදේම නැගිටලා පාඩම් කරන්න පටන් ගත්තා. අරුණිනම් නැගිට්ටේ හොඳටම උදේ වුණාට පස්සේ.

“ මොකද ඊයේ කලින් නිදාගත්ත නිසාද අද උදේම පාඩම් කරන්න පටන් ගත්තේ.”අරුණි ඇහුවා.

“ නැහැ මට නින්ද ගියේ නැහැ.අමුතු හීනයක් දැකලා රෑ මැද ඇහැරුනා”.ඊට පස්සේ මට නින්ද ගියේ නැහැ මම කිව්වා.

“මොකක්ද ඒ අමුතු හීනෙ.” අරුණි ඇහුවා.

“ඒක මහ පිස්සු හීනයක්.ඒ හීනේ හිටියේ මමයි තව වයසක මනුස්සයෙකුයි. මම ඇඳගෙන හිටියේ

හරියට රජ කුමාරිකාවක් වගෙ'. අර වයසක මනුස්සයා මට කිව්වා 'ඔහු පැමිනේවි. ඔහුගේ ආදරයේ පලිය ගැනීමට අනිවාර්යෙන්ම ඔහු පැමිනේවි'.කියලා. බය හිතෙනම දේ තමයි රජ කුමාරිකාවක් වගේ ඇදගෙන හිටපු ඔයාගේ මිනිය මගේ කකුල් දෙක ලග තිබුණා.'' මම කිව්වා.

'' මගේ අම්මෝ ඒක මහ බය හිතෙන හීනයක්නේ. තාම කොල්ලෙක්වත් හොයාගෙන නැති මම දැම්ම නම් මැරෙන්නේ නැහැ.'' අරුණි ආයෙත් සුපුරුදු තැනටම ආවා.

''ඇත්තටම අරුණි මමනම් හිතන්නේ ඔයාට ඔය කොල්ලො ගැන තියෙන උනන්දුව විභහගේ ගැන තිබුනනම් ඔයාට ලංකාවේ පලවෙනියා වෙන්න තිබුනා.''මම කිව්වා.

'' මට ලංකාවේ පලවෙනියා වෙන්න ඕනේ නැහැ.යන්තම් හරි විභහගේ පාස් වුනානම් ඇති.'' අරුණි කිව්වා.

''එහෙම හරි වුවමනාවක්  තියෙන එක ලොකු දෙයක් .ඊයේ රෑ කීයටද නිදාගත්තේ.'' මම ඇහුවා.

''දහයට, ඒ වුනාට වැඩක් වුනේ නැහැ.අර කොල්ලා නිකමටවත් එලියට ආවේ නැහැ.'' අරුණි නිව්වා.

“හොඳ වැඩේ බොරුවට පිස්සු නටනවට.”මමකිව්වා.

“ඒවයින් වැඩක් නැහැ. ඔයා මට පොරොන්දු වුනා අද මාත්එක්ක ටවුන් එකට යන්න එනවා කියලා.” අරුණි කිව්වා”

“ අයියෝ අද යන්නම ඕනේද.මොනවද ඔයාට ඔච්චරටම ගන්න තියෙන්නේ. ඔයා ගිය සතියෙත් ගියා නේද.” මම ඇහුවා.

“ඒ ගියාට මට බඩු වගයක් ගන්න අමතක වුනා.එනවකෝ යන්න.” අරුණි ආයෙත් කිව්වා.

“ඔව්, කොහොමත් ඔයා තනියම ටවුමට ගිහාම ගන්න ගියපු බඩුවලින් බාගයක්වත් අරන් එන්නේ නැහැනෙ.කවුරු හරි කොල්ලෙක්ව දැක්ක ගමන් මෙලෝ සිහියක් නැහැනේ.” මම කිව්වා.

“ඒ කතාවෙත් ඇත්තක් තියෙනවා.කොහොමහරි ඔයා එනවනේ අද මාත් එක්ක ටවුමට යන්න.” අරුණි ඇහුවා.

“ඔව් ඔව්, එනවා.මටත් බඩු වගයක් ගන්න තියෙනවා.”

අරුණිත් එක්ක ටවුමට ගියා කියන්නේ පිස්සු හැදෙන වැඩක් එයා යන්නේ  නම් එයාට ඕනේ බඩු ගන්න හැබැයි කරන්නේ කොල්ලෝ ගැන හොයන එක

එයාගේ වැඩ නිසා හවස් වෙනකම්ම ටවුමේ ඇවිදින්න වුණා මට නම් හොඳටම එපා වෙලා තිබුණේ මුලු දවසම ඇවිදලත් අරුණි අරන් තිබුනේ බඩු ටිකයි

අන්තිමට බෝඩිමට එනකොට හොඳටම හවස් වෙලා ඇන්ටි අරුණිගේ හැටි හොදට දන්න නිසා බැනුම් අහන්න වුනේ නැහැ

ඇවිල්ලා මූණ හෝදගෙන මමයි අරුණියි කෑම කන්න ගියා ඒ වෙනකොට අනිත් අය කෑම කාලා ඉවරයි කෑම කන අතරේ බෝඩිමේ ඇන්ටි අපි හිටපු තැනට ආවා

" අනුරාධා අන්න ඔයාව හොයන්න කෙනෙක් ආවා."එයා කිච්චා.

"කවුද මාව හොයන්න ආවේ.ඉස්කෝලේ කවුරු හරි කෙනෙක්ද." මම ඇහුවා.

"ඉස්කෝලේ කවුරුවත්ද කියන එකනම් මම දන්නේ නැහැ.හැබැයි එයාව හොයාගෙන ආවේ අර ඉස්සරහ බෝඩිමට ආපු අලුත් පිරිමි

ළමයා. එයා ඇවිල්ලා මගෙන් ඇහුවා මෙහේ අනුරාධා කියලා කවුරු හරි නතර වෙලා ඉන්නවද කියලා.මම ඔයා ගැන කිව්වට පස්සේ  එයා තෑන්ක් යූ කියලා ගියා.'' බෝඩිමේ ඇන්ටි කිව්වා.

''එයා මොකටද මාව හොයන්නේ.මම තාම එයාව දැකලවත් නැහැනේ.''මම කිව්වා.

''කෝකටත් ඔයා එයාව හම්බුවෙලා කතා කරලා බලන්නකො.''එහෙම කියලා බෝඩිමේ ඇන්ටි යන්න ගියා.

'' අනූ බොරු කියන්නැතුව ඇත්ත කියනවා. ඔයා ඒ අලුත් කොල්ලව දන්නව නේද.'' අරුණි ඇහුවා.

''පිස්සුද අරුණි, මම ඒ කොල්ලව දැනගන්න තියා තාම දැකලවත් නැහැනේ.''මම කිව්වා.

''එහෙනම් ඉතින් ඒ කොල්ලා මොකටද ඔයා ගැන හොයන්නේ.සමහරවිට අපි මෙහෙට ආවේ නවුද කියලා දන්නැති වුනාට එයා ඔයාව කලින් හම්බුවෙලා ඇති.''අරුණි කිව්වා.

''එහෙම වෙන්න විදිහක් නැහැ අරුණි.මම දන්න කොල්ලොන්ට ඉන්නේ නෑයෝ වෙන අය විතරයි. එහෙම කවුරු හරි එනවනම් අම්මා මට කියනවනේ .''මම කිව්වා.

“කොහොමහරි අපි කවුද කියලා හෙට බලාගමුකෝ.දැන් යමු නිදාගන්න.”අරුණි කිව්වා.

ඊට පස්සේ මමයි අරුණීයි නිදාගන්න ගියා ඇනට ගියාට පස්සේ මම කල්පනා කලේ මට මේ දවස්වල මොකද වෙලා තියෙන්නේ කියලා මුලින්ම මට අමුතු හැඟීමක් දැනුනා ඊට පස්සේ අද කවදාවත් දැකලවත් නැති කෙනෙක් මාව හොයලා ටික වෙලාවක් යනකොට මට නොදැනීම නින්ද ගියා

ඊත් රෑ මැද මම ආයෙත් ඇහැරුනේ කලින් වගේම අමුතු හීනයක් දැකලා කලින් වගේම ඒ හීනේ හිටියේ මමයි අර වයසක මනුස්සයයි ඒත් මේ පාර මගේ අතේ කවුරු හරි කොල්ලෙකුගේ  පින්තූරයක් තිබුනා මම ඇදගෙන හිටියේ රජ කුමාරිකාවක් විදිහට වගේම පින්තූරේ හිටියේ රජ කුමාරයෙක්

වෙනසකට තිබුනේ මම ඒ වෙලාවේ  හිටගෙන හිටියේ රජ මාලිගාවක් ඉස්සරහ ඊට පස්සේ අර වයසක මනුස්සයා මට කිව්වා ‘කිසිම දවසක නැවත ඔහු ඉදිරියට යන්න එපා.එසේ වුවහොත් ඔහුට නැවත තම අතීතය මතක් වේවි’ කියලා.

මේක හීනයක් වුනාටඒක සාමාන්‍යයෙන් දකින හීනයකට වඩා වෙනස් කියලයි මට හිතෙන්නේ ඒ හෑනේ මගේ ලග තිබුන පින්තූරේ හිටපු කෙනා වුනත් මට ගොඩක් පුරුදුයි වගෙයි දැනෙන්නේ

මේක සාමාන්‍ය හීනයක් කියලා හිතලා අමතක කරලා මම ආයෙමත් නිදාගෙන්න උත්සහ කලා ඒත් මට නින්ද යන්නෙම නැහැ මට මෙච්චර කාලෙකට මෙහෙම දෙයක් සිද්ධ වෙලාම නැහැ අරුණිනම් හොදටම නිදි ඒ නිසා මම නැගිටලා කාමරෙන් එලියේ බැල්කනියට ගියා රතන තමයි සාමාන්‍යයෙන් අරුණි පිස්සු නටන තැන මොකද එතනට පිරිමි ළමයින්ගේ බෝඩිම හොදට පේනවනේ

මම ඒ පැත්ත බලාගෙන දිගටම කල්පනා කලේ මට ඊයේ ඉදන් මොකද වෙලා තියෙන්නේ කියලා කොච්චර කල්පනා කලත් මට කිසිම විසදුමක් නම් ලැබුනේ නැහැ මම මෙහෙම කල්පනා කර කර ඉන්න අතරේ පිරිමි ළමයින්ගේ බෝඩිමේ  කවුරුහරිත් එලියට ආවා මට ඒ කෙනාගේ මූණ හරියට පෙනුනේ නැතුවට ඒ කෙනා මාව දැකලා එකපාරටම නතර වුනා ඒත් එක්කම වගේ මම නොදැනුවත්වම  අනිත් පැත්ත හැරුනා මටම හිත්ගන්න බෑ මම ඇයි එහෙම කලේ කියලා මට ඒත් එක්කම මතක් වුනේ මම හීනෙන් දැකපු කෙනාගේ මූණ ඇය් මම අමතක කරන්න හදන දේවල්ම මට ආයෙත් මතක් වෙන්නේ

මම ආයෙමත් කාමරේට ගියා ඒත් මට නින්ද ගියේ නැහැ ඒ නිසා මම නැගිටලා මේසේ ලගට ගියා කොළයක් අරගෙන මම හීනෙන් දැකපු

කෙනාගේ පින්තූරයක් ඇන්දා මම දැකපු විදිහටම රජ කුමාරයෙක් වගේ ඒ රූපේ ඇන්දා

කොහොමහරි මම දන්නෙම නැතුව මේස් උඩම ඔලුව තියාගෙන නින්ද ගිහිල්ලා උදේ අරුණි මාව ඇහැරවනකොට තමයි මට ඇහැරුනේ මම අරුණිට හීනේ ගැන මොකුත් කිව්වෙත් නැහැ පින්තූරේ පෙන්නුවේ නැහැ

ඉරිදා නිසා බෝඩිමේ හැමෝම ඉන්න දවස තමයි අද උදේ කෑමට යන්න කලින් අරුණි එනකම් මම බැල්කනියට වෙලා බලාගෙන හිටියා පහළ මිදුලේ ගහ යට බංකුව ලගට වෙලා කෙල්ලෝ කොල්ලෝ ඔක්කොම කතාව අපේ බෝඩිම් දෙක වෙන වෙනම තිබුනට අපි දෙගොල්ලම හොද යාලුවෝ  ඉරිදට අපි හැමෝම එකතු වෙලා කතා කර කර ඉන්න එක තමයි කරන්නේ මම ඒ දිහා බලන් ඉන්න අතරේ එකපාරටම දැක්ක දෙයක් නිසා ගැස්සිලා ගියා ඒ අය අතරේ හිටියේ මම අර හීනෙන් දැකපු කොල්ලා ඒ කියන්නේ අලුතෙන් බෝඩිමට ආපු කෙනා මම පුදුමෙන් වගේ ඒ පැත්ත බලාගෙන ඉන්නකොට අරුණි ආවා

“මොකද බය වෙලා වගේ බලන් ඉන්නේ”.අරුණි මගෙන් ඇහුවා.

“මොකුත් නැහැ.මම මේබලන් හිටියේ ඔයා කොයි වෙලේ එයිද කියලා. බඩගිනියි.” මම කිව්වා.

“ මොකද ඊයේ රෑ මේසේ ලග නිදාගත්තේ.” අරුණි ඇහුවා.

“මම පාඩම් කර කර ඉන්නකොට එහෙම්මම නින්ද ගිහින්.”මම අරුණිට බොරුවක් කිව්වා.මේ ප්‍රශ්නේ මොකක්ද කියලා හරියට හොයාගන්නකම් අරුණිට මොකුත් නොකියා ඉන්න මම තීරණය කලා.

“එහෙමද, එහෙනම් යමු කන්න.බඩගිනියි කිව්වනේ.” අරුණි කිව්වා.

මම කන්න ගියත් හරියට කෑවේ නැහැ මම කල්පනා කලේ මොකක්ද මේ සිද්ධ වෙන්නේ කියලා මම මුල ඉදන්ම එකින් එක කල්පනා කලා මට මුලින්ම අමුතු හැගීමක් දැනුනා එදා තමයි අලුත් කොල්ලා බෝඩිමට ආවේ එදා ඉදන් තමයි මට අමුතු හීන පේන්න පටන් ගත්තේ එයාගේ මූණ දකින්නත් කලින් මට ඒ කෙනාව හීනෙන් පෙනුනා

“මොනවද අනු ඔච්චර කල්පනා කරන්නේ.බඩගිනියි කියලා නේද ආවේ.කන්නේ නැද්ද?” අරුණි ඇහුවා .එතකොටයි මට මතක් වුනේ ම මපිගාන උඩ අත තියාගෙන කල්පනා කර කර ඉන්නවා කියලා.

කෑම කාලාඉවර වුණහම බෝඩිමේ ඇන්ටි මට පොතක් ගෙනත් දුන්නා. මම පොත් කියවන්න කැමතියි කියලා දන්න නිසා එයා පුස්තකාලෙන්

ගේන පොත් මටත් කියවන්න දෙනවා.ඒක පුනරුප්පත්තිය ගැන පොතක්. ඊට පස්සේ මමයි අරුණියි ආයෙත් කිමරේට ගියා.

මම කලින් දවසේ දැකපු හීනේ මොකක් වුණාත් මම තීරණය කලා අලුත් කොල්ලව හම්බුනොවී ඉන්න. ඒ හීනේට තේරුමක් තිබුණාත් නැතත් එයාව හම්බුනොවී ඉන්න එක හොදයි කියලා මට හිතුනා.

"අනූ අර අලුතෙන් ආපු කොල්ලා ඔයාව හොයව්වා කිව්වා නේද.හම්බුවෙලා අහන්නේ නැද්ද ඇයි කියලා." අරුණි ඇහුවා .

" මගේ ඔලුව ටිකක් රිදෙනවා වගේ.ඒ නිසා අද බැරි වෙයි." මම එහෙම කිව්වේ ඒ කොල්ලා හම්බුනොවී ඉන්න ඕනේ නිසා.

"එහෙනම් ඔයා කාමරේට වෙලා ඉන්න.මම යනවා පල්ලෙහාට." අරුණි කිව්වා.

" අරුණි මට උදව්වක් කරනවද. ඔයා ගිහින් අහනවද අර කොල්ලගෙන් ඇයි මාව හෙව්වේ කියලා." මම අරුණිට කිව්වා.

“ආ හරි, මම අහන්නම් මටත් ඕනේ කොහොමහරි එයාට කතා කරන්න තමයි.”එහෙම කියලා අරුණි පහළට ගියා .

අරුණි ගියාට පස්සේ මම ඇන්ටි දුන්න පොත කියවන්න පටන් ගත්තා. ඒ පොතේ තිබුණේ පුනරුප්පත්තිය ගැන.ඒ පොනට අනුව සමහර මිනිස්සුන්ට එක එක විදිහට තමන්ගේ කලින් ආත්මේ මතක් වෙනවලු.සමහරුන්ට කලින් ආත්මේ එකට හිටපු කෙනෙක්ව මුණාගැහුනම පෙර ආත්මේ මතක් වෙනවලලු.සමහරුන්ට තමන්ගේ පෙර ආත්මේ සිදුවීම් හීනෙන් පේනවලු.

ඒ පොත කියවපු කෙන් සිද්ධ වුණේ මගේ ඔලුව තවත් අවුල් වුණ එක විතරයි.එහෙනම් මම මේ හීනෙන් දකින්නේ මගේ පෙර ආත්මෙද. එතකොට ඒ හීනෙට අනුව මාව මුණාගැහුනොත් අර කොල්ලටත් තමන්ගේ පෙර ආත්මේ මතක් වෙනවා කියලද කියන්නේ.

එහෙනම් ඉතිත් කරන්න තියෙන හොදම දේ තමයි මට පෙර ආත්මේ සම්පූර්ණයෙන්ම මතක් වෙනකම් ඒ කෝලව හම්බුවෙන්නැතුව ඉන්න එකයි ඒත් ඒ කොල්ලා මාව හෙව්වේ එයාට පෙර ආත්මේ මතක් වෙලාවත්ද  කොහොම වුණත් මමයි අරුණියි ඒ

කොල්ලයි අතර  ලොකු බැඳීමක් තියෙනවා කියලා මට තේරුණා

3

ගිය දවස් ටිකේම මේ ප්‍රශ්නේ ගැන කල්පනා කර කර හිටපු නිසා මට පාඩම් කරන්නත් බැරි වුණා ඒත් ඉතින් හිත එක තැනක නැතුව පාඩම් කරන්න පුලුවන්ද ඇය ඉතින් අරුණි දවල් වෙනකම්ම එන්නේ නැහැ කියලා දන්න නිසා මම ගිහින් ඇදේ හාන්සි වූණා දැන්නම් ඇත්තටම ඔලුව රාදෙනවා වගේ

ඔහොම ඉන්න අතරේ මට නොදැනීම ආයෙමත් නින්ද ගිහිල්ලා ඒත් ඇයෙමත් අමුතු හීනයක් පේන්න පටන් ගන්නකොටම අරුණි ඇවිල්ලා මාව ඇහැරෙව්වා වෙනදට ඇන්ටි බනිනකම්ම පල්ලෙහට වෙලා කියව කියව ඉන්න අරුණී  අද කලින්ම උඩට ඇවිල්ලා

ඡමානද අද කලින්ම උඩට ඇවිල්ලා ඇන්ටි බැනලා එලෙව්වද

අයියෝ නැහැ ඇන්ටි එහෙම බනින්නේ නැහැ අහනවකෝ මාර වැඩක් වුණානේ

ඇයි මොකද වුණේ බලාපොරොත්තුවෙන් හිටපු කොල්ලෙක් වෙන කෙල්ලෙක් එක්ක යාලු වෙලාද

පිස්සුද ඒක නෙවෙයි කතාව මම අර අලුත් කොල්ලව හම්බුවෙන්න ගියාඔයාව හෙව්වේ ඇයි කියලා අහන්න

ඉතින් ඒකේ මොකක්ද තියෙන මාර වැඩේ

මාව දැක්ක ගමන් ඒ කොල්ලා එකපාරටම ගැස්සිලා ගියානේ ඊට පස්සේ මගෙන් ඇහුවා ඔයත් අනුරාධා එක්කද ඉන්නේ කියලා හරියට එයා අප් දෙන්නා ගැන දැනගෙන හිටියා වගේ ඒක ඇහුවේ

ඉතින් ඊට පස්සේ මොකද වුණේ

මම ඒ ගැන මොකුත් කියන්න ගියේ නැහැ ඊට පස්සේ මම ඇහුවා ඇයි ඔයාව හෙව්වේ කියලා ඊට පස්සේ එයා අහනවා ඇයි අනුරාධාට ඇවිල්ලා මාව හම්බුවෙන්න බැරිද කියලා මම කිව්වා ඔයාගේ ඔලුව රිදෙන නිසා කාමැර්ට වෙලා ඉන්නවා කියලා ඊට පස්සේ හයා කියනවා ඔයාව හෙව්වේ නිකමටලු

ඊට පස්සේ

ඊට පස්සේ මට තරහ ගිහිල්ලා රවලා බැලුවා මූණ දිහා ඊට පස්සේ මෝඩයෙක් වගේ හිනාවෙලා මේ කොලේ දුන්නා ඔයාට දෙන්න කියලා එහෙම කියලා අරුණි මට නවලා ත්බුණ කොලයක් දුන්නා

මම කොලේ දිගඇරියේ ඕනෙවට එපාවට වගේ ඒත් කොලේ තිබුණ දේ දැකලා මගේ ඇස් දෙක උඩ ගියා අරුණීත් දකින්න ඇති මම කොලේ දිහා බලන් හිටපු හැටි ඒ නිසා එයත් කොලේ දිහා බැලුවා ඒකේ ඇදලා තිබුණේ එක ලිංඡනයක් මට මතකයි මේ ලාංඡනයක් තියෙන මාලයක් මම දකින අමුතු හීනවලදි මම දාගෙන හිටියා ඒ වගේම හීනෙන් දැකපු මාලිගාවෙත් මේ ලකුණ ගහලා තිබුණා ඒ රූපෙට යටින් මෙහෙම ලියලා තිබුණා මේ ලකුණ මට නිකමට හිතිලා

ඇදපු එකක් මම හිතනවා එයා මේ මොකක්ද කියලා දන්නවා ඇති කියලා

මොකක්ද අනු ඒ අන්ඩර දෙමළ කතාවේ තේරුම මේ කොල්ලට පිස්සුද

අනේ දන්නේ නැහැ මගේ ඔලුව රිදෙනවා අරුණි මම දැන් ටිකක් නිදාගන්න ඕනේ මාව ඇහැරවන්න එපා මම මේ ලකුණ මොනන්ද කියලා දැනගෙන හිටියත් ඒ ගැන අරුණිට කියන්න ගියේ නැහැ

ඊට පස්සේ අරුණි ආයෙමත් පහළට ගියා අර ලකුණ දැක්ක වෙලේ ඉඳන් මගේ ඔලුව ආයෙමත් රිදෙන්න පටන් ගත්තා මම ඇය නිදාගත්තත් ගිය පාර වගේ ආය අමුතු හීනයක් පෙනුනේ නැහැ මම ඇහැරෙයකොට දවල් එකට විතර ඇති දවස් දෙක තුනකට පස්සේ තමයි ඔහොම හරියට නින්ද ගියේ

සාමානයෙන් හැම සතියෙම ඉරිදට තමයි අම්මයි තාත්තයි මට කෝල් කරන්නේ මම නිදාගෙන හිටපු අතරේ එයාලා කෝල් කරලා ඇති කියලා හිතුවත් කෝල් කරලා තිබුණේ නැහැ ඒ නිසා මම කෝල් කරත් අම්මයි තාත්තයි දෙන්නම උත්තර දුන්නේ නැහැ

ඒ නිසා මම ෆෝන් එකත් අරගෙනම පල්ලෙහාට ගියේ කෑම කන්නයි අනිත් අයනම් ඒ

වෙනකොට කෑම කාලා ඉවරයි මම අරුණිව හෙව්වත් එයාව හම්බුණේ නැහැ ඒ නිසා මම ඇන්ටිගෙන් අරුණි ගැන ඇහුවා

අරුණි මම හිතන්නේ අර අලුතෙන් ආපු කොල්ලා අනුත්තරත් එක්ක කියව කියව හිටියා කොහේ ගිහින්ද දන්නැහැ මට පේන්නේ මේ පාරනම් ඇත්තටම අනුත්තරට කැමතියි වගේ

එහෙමද එහෙනම් ඉතින් මං මොකටද බාධා කරන්නේ නේද එහෙම කියලා මම තනියමම කෑම කන්න ඉදගත්තා

මම කෑම කන අතරේ එකපාරටම මගේ ෆෝන් එකට කෝල් එකක් ආවා මම හිතුවේ අම්මා කියලයි ඒත් කතා කලේ අම්මා නෙවෙයි පුංචි අම්මා එයා හරියට අඩ අඩා වගෙයි හිටියේ

ඇයි පුංචි අම්මේ මොකද වෙලා තියෙන්නේ

අනූ ඔයා මේක අහලා කලබල වෙන්න එපා ඔයාගේ අම්මයි........ි තාත්තය.........

ඔව් මොකක්ද අම්මටයි තාත්තටයි මොනද වෙලා තියෙන්නේ ඇයි එයාලා අද කතා කරේ නැත්තේ

අනූ අම්මයි තාත්තයි උදේ ඇක්සිඩන්ට් එකකින් නැති වෙලා

පුංචි එහෙම කියනකොටම මගේ අතේ තිබුණ වතුර වීදුරුව එක පාරටම බිමට වැටුනා ඒ සද්දේ ඇහිලා බෝඩිමේ ඇන්ටිත් එතනට ආවා මම පුංචිගේ කෝල් එක කට් කරලා අරුණිට කෝල් කරන්න එයාගේ නම්බර් එක හෙව්වත් මගේ අත් දෙකත් එක්ක වෙව්ලන නිසා ඒක හරියට කරගන්නත් බැරි වුණා ඒ නිසා බෝඩිමේ ඇන්ටි අරුණිට කෝල් කරලා විස්තරේ කියන්නම් කිව්වා

මම කාමරේට දුවගෙන ගියේ අඩ අඩාමයි මෙලෝ සිහියක් නැතුව හිටිය මම බෑග් එක අරගෙන අතට අහුවෙච්ච ඇඳුම් ටිකක් දාගත්තා එතකොට කොහේ හරි ඉදලා ආපු අරුණි මගේ අතින් බෑග් එක අරගෙන මගේ ඇඳුම් ටිකත් දාලා එයත් ඇඳුම් ටික දාගෙන ලෑස්ති වුණා

අනූ අනුත්තර කිව්වා එයාගේ කාර් එකේ අපි දෙන්නව ගිහින් දාන්නම් කියලා

මොනවා වුණාත් ඒ වෙලාවේ තමයි මම හරි සිහියට ආවේ මොනවා වුණාත් මට අනුත්තරගේ ඉස්සරහට යන්න බැහැ

ඕනේ නැහැ අරුණී අපි බස් එකේ යමු මම කඳුලු පිහා ගන්න ගමන් මම කිව්වේ ඒ නිසයි

අනූ ඔයාට මොකද වෙලා තියෙන්නේ ඔයා හැම වෙලේම අනුත්තරව මග හරිනවා කියලා මට තේරෙනවා ඒත් මේ වෙලාවේ ඔයා ඉක්මනට ගෙදර යන්න ඕනේ බස් එකේ ගියොත් පැය ගානක් යාවි

අරුණි කියන කතාවත් ඇත්ත මේ වෙලාවේ කොහෙවත් තියෙන හීනෙකට වඩා මට වටින්නේ ඉක්මනට  ඉක්මනට ගෙදර යන එක ඒ නිසා මම අනුත්තර එක්කම යනවා කියලා තීරණය කරා

හරි එහෙනම් ඉක්මනට යමු එහෙම කියලා මම බෑග් එක අතට ගත්තා

අරුණියි මමයි පහළට එනකොට අනුත්තර එයාගේ කාර් එක ලගට වෙලා හිටගෙන හිටියා මම නිකයටවත් එයාගේ මූණ දිහා බලන්නැතුව ගිහින් කාර් එකේ පිටිපස්සෙන් නැග්ගා අරුණි ඉස්සරහින් නැග්ගා

මම කොහොම කරත් අඩන එක පාලනය කරගන්න බැරි වුණා ඒ නිසා මම කකුල් දෙක උඩ ඔලුව තියාගෙන හිටියා මට සැරින් සැරේ එක එක දේවල් මතක් වෙනවා අපේ පවුලේ හිටියේ අම්මයි තාත්තය මමයි විතරයි දැන් ඉතින් මම තනිවෙලා

ගමට යනකම්ම මම හිටියේ ඒ විදිහටමයි කොහොමත් එතකොට අනුත්තර වැඩිය

මගේ මූණ දක්න්නේ නැහැනේ අරුණි අපේ ගෙදර දන්න නිසා එයා අනුත්තරට පාර කියන්න ඇති ගේ ලග කාර් එක නතර කරපු ගමන්ම මම ගේ ඇතුලට දුවගෙන ගියා

4

මලගෙදර වැඩ වලින් පස්සේ සති දෙකකට පස්සේ අපි ආයෙමත් බෝඩිමට ආවේ අරුණියි අනුත්තරයි දිගටම මගේ වැඩ වලට උදව් වෙවී ගමේම හිටියා ඒ ෂති දෙකේම මට කිසිම විදිහක අමුතු හීනයක් පෙනුනේ නැහැ අනික මම වැඩිපුර නිදාගත්තෙත් නැහැනේ ඔය එක එක වැඩ අතරේ මම අනුත්තරත් එක්ක කතා කලත් එයාගේ කිසිම වෙනසක් පෙනුනේ නැහැ මම හිතන්නේ අර හීනේ මොකක් හරි සාමාන්‍ය හීනයක් වෙන්න ඇති

මළ ගෙදර වැඩ අස්සෙත් අරුණි කරේ පිස්සු නටන එක හැබැයි ඉතින් මේ පාරනම් වෙනදා වගේ කොල්ලෝ දාහක් ගැන කියෙව්වේ නැහැ මොකද ඉතින් එයා මේ පාර පිස්සු වැටිලා ඉන්නේ අනුත්තරටනේ  මේ පාරනම් අරුණි අනුත්තරට ඇත්තටම ආදරේ කරනවා වගේ

අරුණිගේ මේ පිස්සු වැඩ දිහා බලන් ඉන්න කොට නම් වෙලාවකට මට හැමදේම අමතක වෙනවා ඒත් ඉතින් මම තනියෙම ඉන්න හැම වෙලාවකම මම දැන් මේ ලෝකේ තනි වෙලා කියලා මට මතක් වෙනවා දැන් ඉතින් විභාගෙට තව සති දෙකයි තියෙන්නේ  මම ආයෙත් මගේ අර මෝඩ හීනයි පරණ සිද්ධියි අමතක කරලා පාඩම්

කරන්න පටන් ගත්තා අරුණි නම් ඇවිල්ලා ආයෙත් පල්ලෙහට ගියා අනුත්තරව හම්බු වෙන්න අනුත්තරනම් එයාට කැමතිද කියලා දන්නේ නැහැ ඒ වුණාට ඉතින් අරුණිට පිස්සුනේ

මම පාඩම් කරලා පොත් ටික අස් කරනකොට අනුත්තර මට දීපු කොලේ හම්බුණා එතකොට තම ාමට හිතුනේ මගේ හීනේ සාමාන්‍ය එකක් නම් ඇත්තටම ඒ ් මගේ කලින් ආත්මයක් නොවයිනම් අනුත්තර කොහොමද ඒ හීනේ තිබුණ ලාංඡනේ හරියටම ඇන්දේ ඒත් එක්කම මම ඇදපු අනුත්තරගේ පින්තූරෙත් ගත්තා එතකොටයි මම දැක්කේ එයාගේ සමහර ඇහරණ වලත් ඒ ලාංඡනේ තියෙනවා

එතකොට මම දකින හීන ඇත්ත වෙන්න ඕනේ නේද අයියෝ ආයෙත් ප්‍රශ්නයක් මම කාමරෙන් එලියට ඇවිත් බැල්කනියට ආවා පහල ගහ යටට වෙලා අරුණි අනිත් කොල්ලෝ කෙල්ලෝ ටිකත් එක්ක කියව කියව ඉන්නවා හැබැයි එතන අනුත්තර නම් හිටියේ නැහැ මම එතනට වෙලා ගහේ අතු දිහා බලාගෙන ඔහේ කල්පනා කර කර හිටියා ටික වෙලාවක් එහෙම ඉදලා මම කාමරේට යන්න යනකොටයි දැක්කේ කොල්ලන්ගේ බෝඩිමේ බැල්කනියට වෙලා අනුත්තර අමුතු විදිහට හිනා වෙලා මගේ දිහා බලාගෙන ඉන්නවා මටනම් ඒ බලන් හිටපු විදිහ එච්චර ඇල්ලුවේ නැහැ

මම එයා බලන් ඉන්නවා කියලා දැනගනත් එයා ඒ විදිහටම මගේ දිහා බලන් ඉන්නවා එතකොටම පඩිපෙල නැගලා අරුණි බැල්කනිය දිගේ ආවා මම අනිත් පැත්ත හැරිලා අරුණිට කතා කලා  අරුණි ආපු ගමන්ම අනුත්තර ඇතුලට ගියා

ඊට පස්සේ අරුණියි මායි එකතු වෙලා රෑ වෙනකම්ම පාඩම් කරා අරුණිට දැන්නම් විහඟගේ ගැන පොඩි උනන්දුවක් ඇවිල්ලා

ඊට පස්සේ අපි කෑම කන්න පල්ලෙහට ගියා කෑම කන අතරෙත් අනුත්තර මගේ දිහා බලන් ඉන්නවා මම දැක්කා හැබැයි මේ පාරනම් මම දැක්කා කියලා දැක්කම අනුත්තර අහක බලාගත්තා

ඔන්න එදා රෑ මට ආයෙත් අමුතු හීනයක්  පෙනුනා හැබැයි ඒකේ චුට්ටක් විතර වෙනසක් තිබුණා පහුවදා පාන්දර නැගිටපු මම මගේ ළඟ තිබුණ පොතක් අරගෙන අලුත්ම හීනේ ලිව්වා ඊට පස්සේ තමයි මම ඉස්කෝලේ යන්න ලෑස්ති වුණේ සති දෙකකට පස්සේ ඉස්කෝලේ ගිහාම  සුභ ආරංචියක් අහන්න ලැබුනා මේ පාර ප්‍රයිස් ගිවින්ග් එකේ වැඩ ගොඩක් මටයි අරුණිටයි බාර වෙලා තිබුණා මට තිබුනේ සැරසිලි වැඩ ටිකයි

වැඩ සටහන හදන්නයි අරුණිට බාර වෙලා තිබුණේ එදාට තියෙන උත්සවේදි කරන්න ඩ්‍රාමා එකක් හදන්න

ඊස්කෝලේ ඉවර වෙලා අරුණි වෙන යාලුවෝ වගයක් එක්ක ගමනක් ගියා මම හිමීට පාර දිගේ බෝඩිම දිහාවට පයින් ඇවිදගෙන යන්න පටන් ගත්තා ඉස්කෝලේ ළග ඉදන් බෝඩිමට පයින් යනවනම් පැය බාගයක් විතර යනවා  මම ටික දුරක් යනකොට කාර්  එකක් ඇවිල්ලා මගේ ලගින් නතර කරා කවුද කියලා බලනකොටයි දැක්කේ අනුත්තර කියලා

ඔමත් බෝඩිමට යන්නේ එන්න යමු

ඕනේ නැහැ මම පයින් එන්නම් ඊයේ එයා මගේ දිහා බලන් හාටපු විදිහ මතක් වෙලා මම කිව්වා

මට ඔයත් එක්ක කතා කරන්න දේකුත් තියෙනවා එන්නකෝ යමු

අනුත්තර එහෙම කිව්වම මම ගිහින් කාර් එකට නැග්ගා

මොනවද ඔයාට මාත් එක්ක කතා කරන්න තියෙනවා කිව්වේ

මම අර ඔයාට කොලේක ඇදලා දුන්න ලාංඡනේ මනකද ඔයා ඒ ගැන මොනවා හරි දන්නවද

නැහැ මම දන්නේ නැහැ මොකක්ද ඒ ලාංඡනේ මම මොකුත් දන්නෑ වගේ ඇහුවා

ඇත්තටම ඔයා දන්නේ නැද්ද එහෙනම් කමක් නැහැ ඕක මට එක පාරක් හීනෙන් පෙනුන දෙයක්

එහෙනම් ඒක මගෙන් ඇහුවේ ඇයි එතකොට ඔයා කොහොමද මගේ නම දැනගෙන හිටියේ

මෙහෙමයි  මම දැකපු හීනෙදී මගේ ළග ඔය ලාංඡනේ ඇදපු කොළයක් තිබුණා එතකොට ඒ හීනේ හිටපු වයසක මනුස්සයා මට කිව්වා අනුරාධා ඔබට සියල්ල සිහිකරාවි කියලා

හ් කතාව ඇහුවට පස්සේ මම ටිකක් ගැස්සුණා ඒත් මම ඒක පෙන්නන්න ගියේ නැහැ

ඒක නොවයි ඔයා ජොබ් එකක් කරන්නැද්ද කොයි වෙලෙත් කාර් එකේ එහෙ මෙහේ ඇවිදින එකනේ කරන්නේ

මෙහෙමයි මගේ තාත්තා බිස්නස් කරන්නේ එයාගේ එක ඔෆිස් එකක් මෙහේ තියනවා. ඒකේ වැඩ බල්න්න තමයි මාව මෙහෙට එව්වේ. මට ඉතින් කරන්න කලොකු වැඩක් නැහැ. කාර් එක තියන නිසා ඇවිද ඇවිද ඉන්නවා.

එහෙමද මගේ කාර් එකනම් ගෙදර තියෙන්නෙ. ඉස්කෝලෙ විතරෙරෙනෙ යන්නේ ඒ හින්දා ගෙනාවෙ නැහැ. හෙනාවනම් අරුණිගෙන් බේරෙන්න හම්බුවෙන්නෑ.

ආ ඔයාට කාර් එකක් තියනවද ? ඩයිfi tවින් පුලුවන්ද?

පුලුවන් තාත්තා මට පුරුඩු කලා. මේ අවුරුද්දේ මුල ලයිසන් එකත් ගත්තා.

ඔයාගේ තාත්තා මොනවද කලේ.

එයත් බිස්නස් තමා කලේ. දැන් ඉතින් එයා නැති නිසා විහඟගේ ඉවර උන ගමන්ම බිස්නස් වල වැඩ පටන් ගන්න වෙනවා. එහෙම කියනකොට මගේ ඇස් ඩදෙකට කඩුලු පිරුනා

අනේ සොරි මම ඔයාට පරන ඩේවල් මතක් කරනවා නේද? හරි ඔන්න අපි ආවා.

ඒකට කමක් නැහැ. තැන්ක් යූ මාව එක්කන් ආවට.මම යන්නම්. මම එහෙම කියලා කාර් එකෙන් බැහැලා කෙලින්ම කාමරේට ආවා.

මම ඩවල් කෑම ගන්න ගියෙත් නැහැ. ඔහේ කල්පනා කර කර හිටියා. ඊට පස්සේ පොතත් අරගෙන බැල්කනියෙ තිබුන පුටුවට ගියා. මොන ප්‍රශ්නෙ තිබ්බත් විබහගේ හරියට ලිව්වේ නැත්නම් මට මුලු ජීවිත කාලෙම තනියම දුක් විදින්නෙ වෙන්නේ. මම පාඩම් කර කර ඉන්නකොට අරුණි පල්ලෙහා ඉදන් මට කතා කරනවා අහුනා. එයාට පොඩ්ඩක් ඉන්න කියලා මම පල්ලෙහාට යන්න නැගිටිනකොටයි දැක්කේ අනුත්තර කලින් දවසේ වගේම මගේ දිහා බලන් ඉන්නවා. මම දමන්නෑ එයා කොච්චර වෙලාවක් මගේ දිහා බලන් හිටියද කියලා.මම එයා බලන් ඉන්නවා නොදැක්කා වගේ පල්ලෙහාට ගියා. හැබැයි අරුණි එක්ක මම උඩට එනකොට එයා හිටියේ නැහැ.

## 5

අරුණි ආපු ගමන්ම ඇඟ හෝදගන්න ගියා.තනියම කාමරේට වෙලා මම අනුත්තර ගැන කල්පනා කරා. එයා මගේ දිහා ඒ විඩිහට බලන් ඉන්නවා මම දැන් දවස් දෙකක්ම දැක්කා. අනේ මන්ඩා මට තේරෙන්නෑ අනුත්තර මොනවා කරනවද කියලා. මම ඔය ගැන කල්පනා කර කර ඉන්නකොට අරුණි කාමරේට ආවා.

දන්නවද අනූ, ප්රියිස් ගිවින්ග් එකට කරන නට්ය ට හොද ස්ක්රිනප්ට් එකක් ලියලා දෙන්න කියලා මම අනුත්තරට කිව්ව. එයාට ඒ වැඩ පුලුවන්ලු .

ඉතින් එයා ලියලා දෙන්නම් කිව්වද?

ඔව්, මම ප්‍රියන්සිපල් සර්ටත් කිව්වා. සර් කමති උනා අනුත්තරවත් ප්ප්‍ර යිස් ගිවින්ග් එකේ වැඩට එකතු කරගන්නවට.

එහෙමද එහෙනම් මගේ වැඩ වලටත් උඩව්වක් ගන්න පුලුවන් වෙයිනේ.

ඔව්, දන්නවද  අපි මේ පාර ඩ්‍රාමා එකට කර්න්නේ මොකද්ද කියලා කාටවිත්ම කියන්නෙ නැහැ. අඩුම තරමේ ප්‍රින්සිපල් සර්ටවත් , ස්ක්‍රිප්ට් එක ද්න්නේ මායි, අනුත්තරයි, ඩ්‍රාමා ටීම් එකයි විතරෙරෙ.

ඒ උනාට මට ඩැනගන්න පුලුවන්නෙ.

බැහැ ඔයාට කියන්නෙත් නැහැ. ඔයාටත් එදාට තමයි බලාගන්න වෙන්නේ. පුදුම කිරීමක් කියන්නේ පුදුම කිරීමක්.අනුත්තර කිව්වා එයා වෙනස්ම විදිහේ ස්ක්‍රිප්ට් එකක් හදලා දෙනවා කියලා.

හැම වෙලේම අනුත්තර ගැන කියවන්නේ වෙන වැඩක් නද්ද කොයි වෙලේ බැලුවත් කටේ තියෙන්නෙම අනුත්තර.

මේ මොකද මේ, අනුත්තරගේ නම කිව්වම ඔච්චර තරහා යන්නේ මොකද?

අනුත්තරගේ නම කිව්වහම මට තරහා යන්නේ නැහැ. ඒ උනාට ඔයා හැම වෙලේම අනුත්තර ගැන කියවනකොට මට තරහා යනවා.

ඒ මොකද ඒ........ මම අනුත්තර ගැන කියනකොට ඔයාට තරහා යනවා කියන්නේ මට පේන විදහට..........

ඇයි මොකක්ද?

මට පේන විදිහට ඔයා අනුත්තරට කැමතියි වගේ. එහෙමනම් කියනවා. ඔයා කවඩාවත් කොල්ලෙකුට කැමති වෙලා නැහැනේ. ඔයා අනුත්තරට කැමිති නම් මම මගේ අදහස අතැර්ගන්නම්.

මම ඒකට මොකුත් නොකියා පොතත් අරන් එලියේ බැල්කනියට ආවා.

ඔයා මොකුත් කිව්වෙ නැහැ කියන්නේ අනුත්තරට කැමතියි කියන එකනේ. හරි බලමුකෝ. අරුණි කාමරේ ඉදන් කිව්වා.

මම බැල්කනියේ පුටුවෙන් ඉදගත්තා.ඇත්තටම මට එහෙම තරහා යන්නේ මම අනුත්තරට කැමති නිසාද , එහෙම නත්නම් මම අනුත්තර ගැන හිතන්නේ මම දැකපු හීන නිසාද?

අනේ මම දන්නෑ. මේ මාසේ ඉවර වෙනකම් මම ඔය ගැන හිතන්න ඕනේ නැහැ. විභාගේ ඉවර වෙනකම් වෙන කිසිම දෙයක් ගැන කල්පනා නොකර ඉන්න එක හොඳයි.

ඊළඟ දවසේ අරුණි ඉස්කෝලේ යන්න ආවේ නැහැ. එයයි අනුත්තරයි එකතු වෙලා ඩ්‍රාමා එකේ ස්ක්‍රිප්ට් එක හදනවා කිව්වා. මගේ වැඩ කරන්න ඉතින් ඉස්කෝලෙට යන්නම් එපැයි. මේ දවස් ටිකේ නම් විභාගෙට ළඟ නිසා ප්‍රිපියිස් ගිවින්ග් වැඩ පස්සෙ බලන්න කියලයි ප්‍රින්සිපල් කියලා තියෙන්නේ.

ඉස්කෝලේ ඇරිලා මම බෝඩිමට එනකොටත් අනුත්තරයි අරුණියි ස්ක්‍රි ප්ට් එක හඩනවා. ඒ දෙන්නා මට ස්ක්‍රිප්ට් එක බලන්න තහනම් කරලනේ තියෙන්නෙ. ඒ නිසා මම ඒ දෙන්නට අත වනලා උඩ කාමරේට ආවා. මම මූණ හෝද්ගෙන ඒ දෙන්නා ඉන්න තැනට ගියා.

කොහොමද දෙන්නගේ වැඩ. දෙන්නා කෑම කෑවද?මම ඇහුවා.

නෑ තව මේ වැඩත් එක්ක කෑමත් අමතක උනා.අරුණි කිව්වා.

එහෙනම් යමු. දෙන්නම කාලා ඉන්න. නැත්නම් ලෙඩ වෙයි.මම කිව්වා.

හරි එහෙනම් යමුකෝ. අනූ මෙච්චර කියන එකේ  කාලා එමුකෝ. අනුත්තර කිව්වා.

අනූ....... මෙයාගේ නම අනුරාධා ඔයා මොකද අනූ කියන්නෙ. අරුණි අමුතු විදිහට ඇහුවා.

හරි ඉතින් ඔයා කියන්නෙත් අනූ කියලනේ. මමත් එහෙම කිව්වනම මොකද? අනුත්තර කිව්වා.

හරි හරි ඔයාලා මට ඕනේ නමක් කියාගන්න. දැන් යමුද කෑම කන්න. මම කිව්වා.

ඊට පස්සේ අපි තුන් දෙනාම කෑම කන්න ගියා. කෑම කන අතරේ මගේ ෆෝන් එකට මැසේජ් එකක් ආවා. බලනකොට අරුණිගෙන්. මගේ ළග ඉඩගෙන මැසේජ් එකක් එව්වා කියන්නෙ මොකක් හරි පිස්සු කතාවක් තමයි ඉතින්. ඒ නිසා මන් මැසේජ් එක බැලුවා. ‘කවදාවත් මම කෑවද බඩගින්නේ මැරුනද බලන්නැති මෙයා අද ඇවිල්ලා කෑවද ඇහුවේ අනුත්තර ඉන්න නිසා නේද’ කියලයි අරුණි එව්ලා තියෙන්නේ. මම අරුණි දිහා රවලා බැලුවා.

අරුණි බිම බලාගෙන හිනාවෙනවා. කෑම කාලා ඉවර උනාට පස්සේ ඒ දෙන්නා ආයෙත් ස්ක්‍රිලප්ට් එක ලියන්න ගියා. මම කාමරේට ගියා. පාඩම් කරන්නත් කම්මලියි. ඒ හින්දා මම චිත්‍ර යක් අදින්න ගත්තා. මම හීනෙන් දැකපු විදිහට මගෙයි අරුනිගෙයි පින්තූර දෙක ඇන්දා. ඒ පින්තූර දෙකත් අනිත් පින්තූර දෙක තිබුන පොත අතුලටම දාලා බැල්කනියට ගියා.

මම ගෙදර ගිහින් ආවට පස්සෙ ආයෙත් අමුතු විදිහේ හීනයක් පෙනුනෙම නැහැ. ඒ හීන සාමන්‍යව හීන වෙන්නත් බැහැනේ. අනුත්තරත් ඒ වගේ හීනයක් දැක්ලා තියනවනේ.

පහල ගහ යටට වෙලා අනුත්තරයි අරුණියි තාමත් වැඩ. මම ඒ දිහා බලන් ඉන්නකොට අරුණි එකපාර්ටම උඩ බලුවා. ඒ කරලා ආයෙත් පිස්සු මැසේජ් එකක් එව්වා ‘කවුරු දිහාද බලන් ඉන්නේ අනුත්තර දිහාද’ කියලා. ඊට පස්සේ ‘උඩට එනවකෝ මම බලාග්න්නම්’ කියලා මම මැසේජ් එකක් යැව්වා.

එතකොටම වගේ අනුත්තරත් උඩ බැලුවා. එයා මාව දැකලා අර වෙනදට මගේ දිහා බලන් ඉන්නකොට හිනවෙන විදිහට හිනාවුනා. හැබැයි ඒ වෙලවේ නම් මට තරහා ගියේ නැහැ. ඇයි

කියන්න නම් දන්නේ නැහැ. හැබැයි සාමාන්‍යෙයරන් ඉස්සර නම් මට තරහා යනවා. මමත් ටිකක් වෙලා බලන් ඉදලා ඇතුලට ගියා. ටික වෙලාවකට පස්සේ අරුණි කාමරෙට ආවා.

මොනවද අරුණි මේ එවන මැසේජ්. පිස්සු හැදිලද.

මට නම් පිස්සු නැහැ. ඒ උනාට ඔයාටනම් පිස්සු හැදිලා වගේ මට පේන්නේ.

අනේ මේ අරුණි ඔයා පිස්සු නටනවා මදිවට මාවත් ඒවට ඇදලා ගන්නවා.

හා හා ඔයා දැන් කියන්නේ ඔයා අනුත්තරට කැමති නෑ කියලද.

නෑ තමයි. ඔයා දන්නවනේ මම කවදාවත් කොල්ලෙක්ට කැමති නෑ කියලා.

දන්නවා දන්නවා, මම හිතුවා මේ පාරවත් හිත වෙනස් වෙලා කියලා.

මගේ හිත මේ ආත්මෙට වෙනස් වෙන්නෑ.

ඒකත් හොදයි, මට මගේ පාඩුවේ අනුත්තර ගැන හිතන්න පුලුවන්.

මම දැන් එපා කිව්වයෑ. මට මොකදාරුණීට එහෙම කිව්වට මම දනගෙන හිටියා මේ වෙනකොට මම අනුත්තරට කැමතියි කියලා.

# 6

මාසේ ගෙවිලා ගියේ දන්නෙම නැතුව වගේ. අද තමයි විහඟගේ පලවෙනි දවස. එලියට බහිනකොට පලවෙනියටම හම්බුනේ අනුත්තරව. ඒ නිසා දව්ස සුභ වෙයි. මොකද ඒ අනුත්තරනේ. මේ මාසේ දවස් ටිකෙන් ටිකෙ ගෙවෙනකොට මම තේරුම් ගත්තා මම අනුත්තරට කැමතියි කියලා.

ඒත් මම ඒ ගැන කාටවත්ම කිව්වේ නැහැ. කාටවත්ම කියන්නේ ඉතින් අරුණිට තමයි. අරුණිට කිව්වා කියන්නෙ ඉතින් පත්තරේ දැම්මා වගේ තමා.

ගුඩ් මෝර්නින්ග්, අද විහඟගේ පලවෙනි දවස නේද හොදට ලියන්න ආ.

ගුඩ් මෝර්නින්ග් බලන්නකෝ අනේ, මේ අරුණි තාමත් නැහැනේ අදත් පරක්කුයි. විභගයක් කියලා කිසිම ගානක් නැහැ.

අරුණි කොහොමත් ඔහොමනේ. මම දන්න හැටියට එයාට උනන්දුවක් තියෙන්නෙ කොල්ලෝ ගැන විතරයි.

ඔයත් ඒක දන්නවනේ එහෙනම්

ඔව් එයා මේ පාර මගේ පස්සේ  වැටිලා ඉන්නේ කියලත් මම දන්නවා. ඒකනම් ඉතින් මේ පාරත් ඇත්ත වෙන්නේ නැහැ.

එතකොටම අරුණි පල්ලෙහාට ආවා. අපිට වෙලා ගිහින් තිබුන නිසාඅපි ඉක්මනට එතනින් ආවා.අනුත්තර කිව්ව කතාවේ තේරුම මොකක්ද? එයා කිව්වේ මේ පාරත් කියලනේද්. හරියට එයයි අරුණියි කලින් යාලු වෙලා හිටියා වගේ. හැබැයි ඉතින් ඒක එහෙම නෙවෙයි කියල මම දන්නවනේ.දැන් ඉතින් ඔය ගැන හිතලා හරියනවයෑ. එයා මේ පාර කිව්වේ වෙන අදහසකින් වෙන්න ඇති.

කොහොමහරි විභගෙනම් හොදටම ලේසියි. විශයන් තුන සති දෙකකින් ඉවර උනා. දැන් ඉතින් තියෙන්නෙ ප්‍ර යිස් ගිවින්ග් එකේ වැඩ පටන් ගන්න තමයි.

අරුණිනම් දැන් බෝඩිමේ ඇත්තෙම නැහැ. උදේ ඉදන් රෑ වෙනකම්ම ඩ්රා මා ප්රැ ක්ටිස් කරවනවා. මගේ වැඩ ටිකනම් ගොඩක් දුරට ඉවරයි. ප්රෝවග්රැෙම් එක හදලා ප්රිදන්සිපල් සර්ට දුන්නා. සරසන වැඩ නම් තියෙන්නේ කලින් දවසේ කරන්නනේ.

අනුත්තරනම් මේ දවස් වල මොකක් හරි අවුලකින් වගේ ඉන්නේ. දැන් ඉස්සර වගේ බැල්කනියට වෙලා බලගෙන ඉන්නෙත් නැහැ. හැමවෙලේම වගේ කාමරේට වෙලයි ඉන්නේ. ඇහුවොත් කියන්නෙ චිත්රෙ අදිනවා කියලා. එදා කිව්ව කතාවේ තේරුම මොකක්ද කියලා එයාගෙන් අහන්න ගියෙත් නැහැ. ඇහුවත් ඉතින් එයා මොකක් හරි බොරුවක් කියාවි. එයා එහෙමනේ. මම මෙහෙම කල්පනා කර කර ඉන්නකොට අරුණි ඉස්කෝලෙ ඉදලා ආවා.

ආ අද කලින් ඇවිල්ලා නේ.

ඔව්, අද ප්රැමක්ටිස් කලින් ඉවර කලා. මහන්සියි අප්පා.

මහන්සියි කියන්නේ හරියට රේස් එකකට දුවන්න ප්ර ක්ටිස් කරවනවා වගේනේ.

එහෙමා නෑ අහන්නකෝ මට ඔයාගෙන් උදව්වක් ඕනේ. ඔයාට පුලුවන්දා අනුත්තරත් එක්ක

එකතු වෙල ඩ්රා මා එකට ඕනේ ඇඳුම් ටික ඩිසයින්ග් කරලා දෙන්න.

ඒක ඉතින් කරන්න ඕනේ ඇඳුම් මහන කෙනානේ.

නැහැ අනුත්තර කිව්වා එයා නාට්යදට හොද ඇඳුම් ටිකක් ඩිසයින්ග් කරලා දෙන්නම් කියලා. එයාගේ තනියටත් එක්ක ඔයාට කිව්වේ උදව් කරන්න කියලා.

මාරයිනේ, අනුත්තරට බැරි දෙයක් නැහැනේ බලන් යනකොට.

ඒකනම් ඇත්ත තමා. එයා කිව්වා ප්ර ධාන චරිතවල ඇඳුම් ටික ඩිසයින්ග් කරලා දෙන්නම් කියාලා.

ප්රසධාන චරිත ඒ කියන්නෙ ප්රෙධාන චරිත ගොඩක් තියනවනේ. මොකක්ද අනේ ඔය නාට්යනය.

ඒක එදාට බලාගන්නකෝ. දැන් කියන්නකෝ ඔයාට උදව් කරන්න පුලුවන්ද කියලා.

හරි මම උදව් කරන්නම්. මටත් හෝල් එකේ ඩෙකරේශන් ගැන එයා එක්ක කතා කරගන්න

ඕනේ. හැබැයි මේ දවස් වල එයා  වැඩිය මාත් එක්ක කතා කරන්නෙ නම් නැහැ. ඔයාම එයාට කියන්න.

මේ දැන් මට තව වැඩකට යන්න තියෙනවා. ෆෝන් එක දෙන්නකෝ. මම අනුත්තරගේ  නම්බර් එක දාලා දෙන්නම්.ඔයාම එයාට කතා කරන්න. එහෙම කියලා අරුණි මගේ ෆෝන් එක අරගෙන අනුත්තරගේ නම්බර් එක දාලා දුන්නා. ඊට පස්සේ එයා ආයෙත් ගියා.

මම ෆෝන් එකත් අතේ තියගෙන කල්පනා කරේ අනුත්තරට කතා කරනවද  නැද්ද කියලා. කොහොමත් මේ දවස්වල වැඩිය එයා කතා නැති නිසා ප්රරශ්නේ මොකක්ඩ කියලා කතා කරලා ඇහුවනම් හරි. ඒ නිසා මම එයාට කෝල් එකක් ගත්තා.

හලෝ අනුත්තර

මේ අනු නේද . මම ඔයාට කතා කරන්නමයි හිටියේ. පල්ලෙහා ගහ ලගට එනවද?

හරි මම එන්නම්. එහෙම කියලා  ෆෝන එක තිබ්බ මම ඉකමනට පල්ලෙහාට ගියා. මම පල්ලෙහාට යනකොට අනුත්තරත් ඇවිල්ලා හිටියා.

ඇයි ඔයාට මාව හම්බුවෙන්න ඕනේ කිව්වේ. මම ඇහුවා.

ඊට කලින් කියන්නකෝ ඔයා මට කෝල් කරේ ඇයි කියලා. අනුත්තර කිව්වා.

ආ ඒක ලොකු දෙයක් නෙවෙයි. අරුණි මට කිව්වා ඔයාට ඩ්‍රාමා එකේ ඇඳුම් ටික ඩිසයින්ග් කරන්න උදව් කරන්න කියලා. ඒ ගැන අහන්න කතා කලේ. මම කිව්වා.

ඒ වැඩ ටිකනම් දැන් ඉවරයි.

එහෙමද එතකොට ඔයා ඇයි මට කතා කරන්න ඕනේ කිව්වේ.

ඒකද, ඒකනම් ගොඩක් වැදගත් දෙයක්.

මොකක්ද ඒ ගොඩක වැදගත් දේ. කියන්නකෝ බලන්න.

කියන්න කලින් ඉස්සර වෙලා පොරොන්දු වෙන්න ඔයා අනිවර්යෙ න්ම උත්තරයක් දෙනවා කියලා.

ඔයා කියන්නේ මොකක්ද කියලා දන්නැතුව මම කොහොමද පොරොන්දු වෙන්නෙ. හරි මම පොරොන්දු වෙන්නම් කියන්නකෝ.

අනූ මම ඔයාටා අදරේ කරනවා. මම මේක කියනන ගොඩක දව්සක ඉදල බලගෙන හිටියේ. මම ඔයාව දැක්ක දවසේ ඉදලමයි මම ඔයාට ආදරේ කරන්නේ. ඔන්න ඔයා පොරොන්දු උනා මට උත්තරයක් දෙනවා කියලා  හරිද?

මට මේ කතාව ඇහුවම හිතාගන්න බැරි උනා. මම අනුත්තරට කැමතියි කියලා කියන්නයි ගියේ. ඒත් එතකොටම වගේ ෆෝන් එකට කෝල් එක්ක් ආවා. ඒ කෝල් එක ආවේ තාත්තාගේ ඔෆිස් එකෙන්

අනුත්තර තාත්තාගෙ බිස්නස් එකේ වැඩ වල පොඩි ප්ර ශ්නයක් වෙලා. මට මේ දැන්ම ගෙදර යන්න වෙනවා. එහෙම කියලා මම කාමරේට එන්න දුවගෙන ආවා.

එතකොට මගේ උත්තරේ. අනුත්තර ඇහුවා.

මම ගෙදර ගිහින් ඇවිල්ලා ඔයාගේ උත්තරේ දෙන්නම්. මම එහෙම කියලා කාමරේට ගියා. බෑග් එක අරගෙන මට ඕනෙ කරන බඩු ටික දාගෙන ඉවර වෙලා  මම අරුණිට කෝල් කරා. ඩ්රාගමා එකේ වැඩ නිසා අරුණිට මාත් එක්ක එන්න විඩිහක් තිබුනේ නැහැ

කොහොමත් බිස්නස් එකේ වැඩ ටික බලන්න මට සතියක් විතර ඉන්න වෙයිනේ. මම ගෙදර යන්න පිටත් උනේ ගොඩක් සතුටින්. ඒත් මම දැනගෙන හිටියේ නැහැ එදා තමයි මන් සතුටින් ඉන්න අන්තිම දවස කියලා.

# 7

බිස්නස් එකේ වැඩ ටික ඉවර වෙන්න සති දෙක්ක විතර ගියා. ඊට පස්සේ අද තමයි ආයෙමත් බෝඩිමට ආවේ. හැබැයි ඉතින් මන් වැඩි කැමත්තකින් නෙවෙඉ ආවේ. ප්රඉයිස් ගිවින්ග් එකේ වැඩ තිබ්බේ නැත්නම් මම කොහොමටවිත් ආපහු එන්නේ නැහැ. ඒකට ගොඩක් ලොකු හේතුවක් තියෙනවා.

ආව ගමන්ම මට හම්බුනේ අරුණිව. දැන් තියෙන තත්ත්වේ අනුව මට කොහොමටවත් එයාට මුහුණ දෙන්න පුලුවන්කමක් තිබුනේ නැහැ. ඒත් මම කොහොමහරි මාව පාලනය කරගෙන  එයත් එක්ක කතා කලා.

අම්මෝ් අනූ, ඔයා නැතුව වැඩ ටික කරේ මාර අමාරුවෙන්. සතියයි කිව්වට සති දෙකක්ම ගියානේ ඔයාට එන්න.

ඔව්, වැඩ ටිකක් වැඩි උනා.

මම මාර කම්මැලි කමෙන් හිටියේ. අනුත්තරත් ගිය  සතියේ ගියා. එයා එන්නෙත් හෙට.

ඉතින්, ඒක හොදයි.

මොකක්ද? ඒක හොදයි? අනූ ඔයාට මොකද මේ වෙලා තියෙන්නෙ. ඔයා හොද සිහියෙන්ද ඉන්නේ.

අරුණි, මට දැන් ඉස්කෝලෙට යන්න තියෙනවා. ප්‍රණයිස් ගිවින්ග් එක හෙටනේ මට වැඩ තියෙනවා.

එහෙම කියලා අරුණිව මග හැරපු මම ඉස්කෝලෙට යන්න පල්ලෙහාට ආවා. මම ගෙදර ඉදලා එනකොට කාර් එක අරන් ආපු නිසා කාර් එකෙන්ම ඉස්කෝලෙට ගියා.

කරන්න ඕනෙ වැඩ ටික වැඩ කරන අයට බාර දීලා  මම ඉදගෙන බලන් හිටියා. එතකොටයි

මම දැක්කේ අරුණිගේ නාට්‍ය යේ ස්ක්‍රිකප්ට් එක පුටුවක් උඩ තියෙනවා.

මගේ ඔළුවේ තියෙන අවුල හරියන්නත් එක්ක කියලා මම ස්ක්‍රිවප්ට් එක අරන් කියවන්න පටන් ගත්තා. දෙවියනේ, ඒක කියවපු එකෙන් සිද්ධ උනේ මගේ ඔළුව තවත් අවුල් වෙච්ච එක විතරයි. අනුත්තර හැම දේම දැනගෙනයි ඉන්නේ.

ඔයාලා බලනවා ඇති මම මේ මොනවා කරනවද කියලා. මම ඒ ගැන තව ටිකකින් ඔයාලට කියන්න්ම්

දැන් ඉතින් මට කරන්න තියෙන්නේ එකම එක දෙයයි.ඒ තමයි මේ හැම දෙයක්ම අතෑරලා දාලා මෙහෙන් යන්න යන එක.

වැඩ ටික ඉවර උන ගමන්ම මම කෙලින්ම බෝඩිමට ආවා. ඒ වෙනකොට අනුත්තර බෝඩිමට අවිල්ලයි හිටියේ. එයගේ කාර් එක මිදුලේ නවත්තලා තිබුනා. මම කෙලින්ම ගියේ කාමරේට අනුත්තර ඒ වෙලාවේ හිටියේ බැල්කනියේ. එයා මාව දැක්ලා වෙන්න ඇති මගේ ෆෝන් එකට කෝල් එකක් ගත්තා. මම එයාගේ කෝල් එක කට් කරලා ෆෝන් එක ඕෆ් කරා.

ඊට පස්සේ මම කාමරේ තිබුන මගේ හැම බඩුවක්ම පැක් කර ගත්තා. ඒත් මම අරුණිට දේවල් දෙක්ක ඉතුරු කරලා යනවා. ලියුමකයි, මගේ හීන ලියපු පොතයි.

මම ගමේ ගියපු දවසේ ඉදන් මට ආයෙත් අර හීන පේන්න පටන් ගත්තා. මේ පාර මම හීනෙන් සම්පූර්ණ කතාවක්ම දැක්කා. ඒ තමයි මගේ කලින් ආත්මෙක කතාව. මම දන්නෑ මේ වගේ  දේවල් ලෝකෙ වෙන කොහෙවත් සිද්ද  වෙනවද කියලා. ඒඋනාට කලින් සති දෙකේ මම දැන්ගත්තා ඒක මගේ පෙර ආත්මේ කතාව කියලා.

මට මේ ආත්මෙත් ගිය ආත්මෙ කරපු වැරැද්දම කරන්න බැරි නිසා මම හැමදේම අතෑර්ලා දාලා මම යන්න යනවා. මගේ ආදරේ පවා. හැමදේම බාර වෙන්නේ අරුණිට තමයි.

කාටවත්ම හොයාගන්න බැරි තරම් ඈතට  මම යනවා. මගේ මේ ලියුමයි හීන පොතයි කියෙව්වම අරුණියි අනුත්තරයි තේරුම් ගනියි මගේ තත්ත්වේ. කොහොමටත් අනුත්තර දැනටමත් කතාව දන්නවනේ. හැබැයි එයාගේ ස්ක්රිනප්ට් එක්ට වඩා න්ම් කතාව ටිකක් දිගයි වගේම වෙනස්.මෙතනින් එහාට මගේ ආදරේ  ඇතුලු හැම දෙයක්ම බාර වෙන්නේ අරුණිට.

****************************************

අනුත්තර උදෑසනම අවදි උනේ දුරකතනය නාද වන හඩින්.

හලෝ අනුත්තර.මම මේ අරුණි කතා කරන්නේ.

ඔව් අරුණි කියන්න.

අනුත්තර ලොකු ප්රශ්නයක් ඉක්මනට පල්ලෙහා ගහ ළගට එන්නකෝ.

හරි විනාඩි දහයක් දෙන්න මම එන්නම්.

------------------------------------------------------------

ඇයි අරුණි මොකක්ද වෙලා තියෙන්නෙ. හදිස්සියක් කිව්වේ.

අනුරාධා නැහැ. එයා ගිහිල්ලා.

ගිහිල්ලා කියන්නේ මොකක්ද ඒ කතාවේ තේරුම. එයා ඊයේ ආවා නේද.

ඔව්, එයා ඊයේ ආවා. එයා මොකක් හරි අවුලකින් වගේ හිටියේ. මාත් එක්කත් වැඩිය කතා කලේ නැහැ. එයා ඊයේ ඉස්කෝලේට ගියාට පස්සේ මමත් වැඩකට එලියට ගියා. මම එද්දිත් එයා හිටියේ

නැහැ. මම හිතුවා වැඩ නිසා එයා එද්දී රෑවෙයි කියලා. අද උදේ බලනකොට තමයි දැක්කේ එයාගේ බඩු ටිකත් ඔක්කොම අරගෙන ගිහිල්ලා.

එතකොට යන තැනක් ඔයාටවත් කියල ගියේ නැද්ද?

නැහැ අනුත්තර, එයාගේ ෆෝන් එකත් ඕෆ් කරලා. හැබැයි එයා මේ ලියුමයි පොතයි තියලා ගිහින් තිබුනා.

මොනවද ඔය ලියුමේ කියලා තියෙන්නේ. ලියුමෙවත් නැද්ද යන තැන්ක් ගැන කියලා.

මමත් තාම බැලුවේ නැහැ අනුත්තර. නැගිටපු ගමන්මයි මම ඔයාට කතා කලේ.

එහෙනම් දෙන්න ඕක මම කියවන්න.

**දයාබර අරුණී,**

**මම හැම්දේම අතෑරලා යන්න යනවා. ඒ ඇර් මට කර්න්න වෙන දෙයක් ඉතුරුැර් වෙලා නැහැ. ඔයා තාමත් නොදන්න දෙයක් තියනවා. ඒ තමයි**

අනුත්තරට මම ආදරේ කරනවා කියන එකත් අනුත්තර මට ආදරේ කරනවා කියන එකත්. මම හැමදේම අතෑර්ලා යන්න හේතුවත් ඒකයි.

මම ගොඩක් ලොකු පව්කාරියක් අරුණී. මම කලින් ආත්මෙකදි කරලා තියෙන්නෙ ලොකු පවක්. මම දන්නවා ඔයත් අනුත්තරට ආදරේ කරනවා කියලා. ඒ නිසා මට මේ ආත්මෙදිත් ඒ වැරැද්දම කරන්න බැහැ. ඔයාවයි අනුත්තරවයි වෙන් කරන්න මට බැහැ.

මම මේ ලියුමත් එක්ක තියලා යන පොතේ ඒ හැම්දේම තියෙනවා. මම දන්නෑ මටෛ අනුත්තරටෛ වගේ ඔයාටත් පෙර ආත්මේ මතක් වෙයිද කියලා. අනුත්තරනම් මේ වෙනකොටත් හැමදේම දන්නවා. කොහොම උනත් ඔයා ඔය කතාව කියෙව්වම තේරුම් ගනියි මම ඉන්න තත්ත්වේ. ඔය කතාව අත්ත්ම කතාවක් කියලා ගිය සති දෙකේ මම හොයගත්තා. මට බයයි අනුත්තර හැමදේම කරන්නෙ මගෙන් පලිගන්න්ද කියලා.

මම යනවා අරුණී. මම ඉන්නේ කොහෙද කියලා හොයන්න එපා.මම සමහරවිට වැඩි කාලයක් ජීවත් වෙන එකක් නැහැ. මොකද මම අනුත්තරට ඒ තරමටම ආදරේ කරනවා. ඒත් මට කලින් ආත්මෙක

**කරපු පවම මේ ආත්මෙත් කරන්න බැරි නිසා මම ඒ ආදරේ ජීවත් වෙන තාක් කල්ම හිතේම තියාගෙන ඉන්නම්. ඔය දෙන්නටම සුභ අනාගතයක් ප්රාකර්ථනා කරනවා.**

**මීට ,**
**අනුරාධා**

අනුත්තර මොකක්දා මේ පෙර ආත්ම කතාව . අර කතාවමද

එහෙම වෙන්න ඇති. ඔයාම ඔය පොත කියවලා බලන්නකෝ. මට අද වැඩ ගොඩක් තියෙනවා මම යනවා අරුණි. අනූව හොයන්නත් එපැයි.

එහෙම කියපු අනුත්තර එයාගේ කාමරේට යන්න ගියා. අරුණිත් එයාගේ කාමරේට ගියේ අනූ කියන කතාවත් එයා දන්න කතාවමද කියලා ඉකමනට දැනගන්නයි.

ජ්රයිස් ගිවින්ග් එකේ වැඩ ඉවර උන ගමන්ම් අරුණි කලේ අනුරාධාගේ පොත කියවන්න ගත්ත එක.

# 8

අරුණී ඔයාට මතකද මම දවසක් කිව්වා අපි දෙන්නා රජ කුමාරියෝ වගේ ඇදගෙන ඉන්න සිද්ධි හීනෙන් පේනවා කියලා. මම හිතුවේ මට පේන හීනවලින් පේන්නේ අපේ පෙර ආත්මෙනම් ඒක ගොඩක් ඈත කාලේ ආත්මෙක කතාවක් කියලයි.

ඒත් මම හිතුව විදිහ වැරදියි. කලින් ආත්මෙදි මමයි, ඔයයි, අනුත්තරයි හොදම යාලුවෝ තුන්දෙනෙක්. ඒ කාලේ අපි තුන්දෙනාම වැඩ කලේ එක නාට්‍යව කණ්ඩායමක.මට මුලින් පෙනුන හීනවලදි පෙනිලා තියෙන්නෙ අපි නාට්‍යයි වලදි වැඩ කරපුවා.

අපි යාලුවෝ තුන්දෙනා නාට්‍යයු වල වැඩ කරන අතරේ මම අනුත්තරට ආදරේ කරනවා.හැබැයි ඒ වෙනකොට ඔයත් අනුත්තරට

ආදරේ කරනවා කියලා මම දැනගෙනයි හිටියේ. හැබැයි අනුත්තර ඒ වෙනකම් කිසිම කෙල්ලෙකුට කැමති වෙලා හිටියේ නැහැ.

ටික කාලෙයක් අපි තුන්දෙනා එකට වැඩ කරගෙන යනකොට අනුත්තර දවසක් මට කියනවා එයා කෙනෙක්ට ආදරේ කරනවා කියලා. එයා කියනවා ඒ කෙනාව කැමති කරගන්න උදව් කරන්න කියලා.මම හිතන්නේ ඒ ඔයා කියලා.

මම ඔයාගේ හොදම යාලුවා උනාට මම ඔයාට වෛර කරන්න පටන් ගන්නවා.

ඔය අතරෙ අපි තුන්දෙනාට තවත් නට්ය ක රගපන්න හම්බුවෙනවා.ඒක රජ කතාවක්. ඒ කතාව තමයි මම මුලින්ම හීනෙන් දැකලා තියෙන්නෙ.ඒ කතාව තමා අපේ ජීවිත වෙනස් කරන්නේ.

ඒ කතාවේ රජ කුමාරිකාවක් විදිහට රගපාන මම ඒකෙදි ප්රුධාන චරිතයක්. ඔය දෙන්නා තමයි අනිත් ප්රපධාන  චරිත දෙක.ඒ කතාවයි අපේ ජීවිත කතාවයි දෙකම ගොඩක් සමානයි. ඒ කතාවෙදි ප්රවධාන චරිතේ එයගේ අදරේ ලබා ගන්නා අනිත් රජ කුමරිව මරන එකයි අන්තිමට වෙන්නේ.

මේ නට්යතයෙන පස්සේ මමත් තීරනය කරනවා මගේ ආදරේ ලබගන්න  නම් මම ඔයාව මරන්න ඕනේ කියලා.

මම ඒකට ගොඩක් කල් ප්ලෑන් කරනවා. අන්තිමේට මම එක දවසක අනුත්තර නතුව ඔයාව විතරක් තනියම ගෙන්න ගන්නවා. ඊට පස්සේ මම ඔයාගේ බීම එකට වහ දාලා දෙනවා. ඔයා ඒක බීලා මැරෙනවා. ඊට පස්සේ මම අනුත්තරට පණිවිඩයක් යවනවා ඔයාගේ ආදරේ සියදිවි නසාගෙන කියලා.

ඊට පස්සේ මගේ හැම සැලැස්මක්ම කනපිට පෙරලෙනවා. එයා ආදරේ කරපු කෙනා මැරිලා කියලා දැනගත්තට පස්සේ අනුත්තර ඒ දුකට සියඩිවි නසාගන්නවා.

මුලදී ඔයාගේ මරනේ සියදිවි නසාගැනීමක් විදිහට ඔප්පු කරන්න මාට පුලුවන් උනත් අන්තිමේදී මාව පොලීසියට අහු වෙනවා.මට ජීවිතාන්තය දක්වා සිරදඩුවම් හම්බුවෙනවා. අන්තිමට මට අනුත්තරයි මගේ ජීවිතෙයි දෙකම නැති වෙනවා.ඒ නිසා මම සතියක් යන්න කලින් හිරේදිම සියදිවි නසාගන්නවා.

ආදරේ ලබාගන්න  කියලා ඔයාගේ ජීවිතේ නැති කරපු මමම අන්තිමේට මගේ ජීවිතෙත් නැති කරගන්නවා.

---

ඒ නිසා අද මම හැමදේම අතෑරලා දාලා යන්න යනවා.

මම ගෙදර යන්න කලින් අනුත්තර මගෙන් කැමත්ත ඇහුවා. මම එයාට කිව්වා ගෙදර ගිහින් අවිල්ලා මගේ උත්තරේ දෙන්නම් කියලා.මම එයාට දෙන්න හිටිය උත්තරේ තමයි ‘ඔව්’ කියන එක.

ඒත් මට ගිය ආත්මෙදි වගේ මේ අත්මෙදිත් ඔයාගේ ආදරේ ඔයාගෙන් උදුරගන්න බැහැ.

සමහරවිට මම ගිය ආත්මේ කරපු පව්කම නිසා වෙන්න ඇති මේ ආත්මෙදි මට කිසිම කොල්ලෙකුට ආදරේ කරන්න බැරි උනේ.

අරුණි, අනුත්තරත් ඔයාට කාලයක් යනකොට ආදරේ කරන්න පටන් ගනීවි. ඒ නිසා අරුණි, අනුත්තරයි ඔයයි සතුටින් ජීවත් වෙන්න. ඔයාල බදිනකන්වත් මම ජීවත් වෙයි ද දන්නැහැ

හැබැයි ඉතින් මම ජීවත් වෙන තාක් කල් අනුත්තර මට කොච්චර වෛර කරත් මම එයාට ආදරෙයි.

තව දෙයක් අරුණි, මාව හොයන්න උත්සහා කරන්න එපා. මොකද ආයෙත් පාරක් අනුත්තර්ව දැක්කොත් මට දරාගන්න බැරි වෙයි.

# 9

හ්ම්, එහෙනම් එයාටත් අන්තිමේට ඒ දේවල් මතක් වුණා. හැබැයි ඉතින් අපි දෙන්නා දැනගෙන හිටපු ඒ අතීතේ දැනගන්න එයාට ගොඩක් කල් ගියා නේද අනුත්තර.

ඔව්, හැබැයි ඉතින් ඒකෙන් සිද්ධ වුනේ මම බයෙන් හිටියා වගේම එයා මාව අතෑරලා ගියපු එකයි.

දැන් අපි මොකද කරන්නේ. එයා කොහෙද යන්න ඇත්තේ.

හිතාගන්න බෑ කොහේ ගියාද කියලා.හැබැයි ඉතින් කොහේ හිටියත් මම එයාව හොයාගන්නවා.මට එයාව නැති කරගන්න බැහැ.

එයා හිතන් ඉන්නේ ඔයා එයාගෙන් පලිගන්න මේ දේවල් කරනවා කියලයි.

එයා එහෙම හිතන එක සාධාර්ණයි. එයා දන්නේ එයා කරපු ගොන් කම් ටික විතරනේ.

ඔව්, එතකොට අපි කොහොමද එයාව හොයාගන්නේ.

අපි ඉස්සර වෙලාම එයාගේ ගෙදරට ගිහින් බලමු. එයා කොහේ ගියත් ගෙදර ගිහින්නේ යන්න ඇත්තේ. එයාගේ පුංචිගෙන් අහලා බලමු.

එතකොට කවද්ද අපි යන්නේ.

ඔයාට පුලුවන්නම් මේ දැන්ම උනත් යන්න මට පුලුවන්. මට එක විනාඩියක්වත් බලන් ඉන්න පුලුවන් කමක් නැහැ.

හරි එහෙනම් මටත් ප්රනශ්නයක් නැහැ අපි දැම්ම යමු.

එහෙනම් අරුණි, ඔයාගේ ඇඳුම් ටිකකුත් අරන් එන්න. එයාව හම්බුවෙනකම් දිගටම හොයන්න ඕනේ.කොහේ යන්න වෙයිද දන්නැනේ.

හරි මට විනාඩි දහයක් දෙන්න. මම ඉක්මනට එන්නම්. ඇන්ටිටත් කියලා එන්නම්.

එහෙම කියපු අරුණි ඉක්මනට කාමරේට දුවගෙන ගියා. ඇදුම් ටිකකුත් දාගෙන ඉක්මනට ආවා.

හරි අපි යමු. මම ඇන්ටිටත් කියලයි ආවේ.

හරි යමු. එහෙම කියලා අනුත්තර කාර් එකට නැග්ගා. අරුණිත් බෑග් එක පිටිපස්සට දාලා ඉස්සරහින් කාර් එකට නැග්ගා.

පැය කීපයක ගමනකින් පස්සේ අනුත්තරයි, අරුණියි අනුරාධාගේ පුංචි අම්මාගේ ගෙදර ළඟට ආවා. ඊට පස්සේ ඒ දෙන්නා ඇතුලට ගියා.

ආනේ, මේ ළමයි දෙන්නා නේද, කොහොමද ඔයාලට?

අපි හොඳින් ඉන්නවා ඇන්ටි. අපි ආවේ පොඩි විස්තරයක් දැනගන්න.අරුණි කිව්වා.

මොනවා ගැනද ඔයාලට දැනගන්න ඕනේ.

ඇන්ටි අපි ආවේ අනූ ගැන විස්තරයක් දැනගන්න. එයා කොහේ ගිහිල්ලද දන්නේ නැහැ.

එයා ගැනද, එයා දැන් දවස් තුනකට කලින් ගෙදර ඉඳලා ගියේ. එයා කිව්වේ එයගේ

බෝයිෆ්රෙ න්ඩ් එක්ක රට යනවා කියලයි. මම හිතන් හිටියේ  එයා යාලුවෙලා හිටියේ මේ පුතා එක්ක කියලයි. ඇයි එයා ඔයාලට කිව්වේ නද්ද?

නැහැ ඇන්ටි, එයා අපිට කිව්වේ නැහැ. හරි අපි එහෙනම් යන්නම් ඇන්ටි.

අනුත්තරයි අරුණියි ඇවිත් කාර් එකට නැග්ගා.

අනේ  දෙවියනේ, එතකොට අනූට වෙන කොල්ලෙක් හිටියද. අනුත්තර කිව්වා.

මම දන්න තරමින් එයාට කොල්ලෙක් හිටියේ නැහැ. මම අවුරුදු හයක්ම එයා එක්කනේ හිටියේ.

ඔයා දැනන් ඉන්න නැතුව අති අරුණි. ඒ නිසා වෙන්න ඇති එයා කිසිම කොල්ලෙකුට කැමති නෑ වගේ හිටියේ.

ඒ උනාට එයා ලියුමේ ලියලා තියෙනවනේ ඔයාට ආදරෙයි කියලා. ඔයාට දෙන්න හිටපු උත්තරේ ඔව් කියන එක කියලා.

අනේ මට තේරෙන්නෑ අරුණි. මගේ ඔලුව හොඳටම අවුල් වෙලා.

ඔයා ඔලුව අවුල් කරගන්න එපා. මම හිතන්නෑ එයාට කොල්ලෙක් හිටියා කියලා. අපි දැන් කොහෙද යන්නෙ.

අනූගේ ඔෆිස් එකට. එයා මට කියල තියෙනවා බිස්නස් වැඩ බලන්න ඉන්නේ එයා විතරයි කියලා. ඒ හින්දා අපිට මොකක් හරි විස්තරයක් ඩැනගන්න පුලුවන් වෙයි.

ඊට පස්සේ ඒ දෙන්නා අනූගෙ ඔෆිස් එක තිබුන තැනට ගියා.කාර් එක පාර්ක් කරලා අරුණියි අනුත්තරයි මැනේජර්ව හම්බුවෙන්න ගියා.

මොනවද ඔයාලට මගෙන් දැනගන්න ඕනේ.

මෙහෙමයි සර් අපි දෙන්නා මේ කම්පැනි එකේ දන් අයිතිකාරිය අනුරාධාගේ යාලුවෝ. දැන් දවස් තුනක ඉදලා එයා ගැන කිසිම විස්තරයක් නැහැ. අපි දන්න තරමින් මේ බිස්නස් එක බලාගන්න එයා විතරයි ඉන්නෙ. ඒ නිසා එයා මෙහේ අයටවත් කතා කරලා තියෙනවද කියලා දැනගන්න ඕනේ අපිට.

ඒ ගැන මම ලොකු විස්තරයක් දන්නෙ න්ම් නැහැ. එයා යනවා කියන එකනම් අපිට දන්වලා තිබුනේ. කම්පැණි එකේ වැඩ බලන්න කෙනෙකුත් පත් කරලයි එයා ගියේ.

එතකොට බිස්නස් වලින් එන සල්ලි වලට මොකද කරන්න කියලාතියෙන්නෙ.

ඒව එයාගෙ අකවුන්ට් එකට දාන කියලා තමයි කියලා තියෙන්නෙ.

එයා යන තැනක් කාට හරි කියලා තියෙනවද දන්නැහැ.

නැහැ අනුරාධා මිස් ගිය සතියේ ඔෆිස් එකේ අය ඔක්කොම ගෙනල්ලා මීටින්ග් එකක් තිබ්බා. ඒ වෙලාවේ තමයි එයා අපිට යනවා කියලා කිව්වේ. යන්නේ කොහෙද කියන එක ගැන අපිට මොකුත් කිව්වේ නැහැ.

එයා ඔයාලට බැන්ක් අකවුන්ට් එක ගැන විස්තර දීල ඇතිනේ. ඒක ලංකාවේ එකක්ද වෙන රටක එකක්ද.

එයා අපිට සල්ලි දාන්න කියලා තියෙන්නෙ නම් ලංකාවේ අකවුන්ට් එකකට.

හරි සර් තැන්ක් යූ. අපිට මේ විස්තර දුන්නට.

එහෙම කියලා අනුත්තරයි අරුණියි එලියට ආවා. ඊට පස්සෙ දෙන්නා ආයෙත් පිටත් වුනා.

අනු බෝයිෆ්රෙ න්ඩ් එක්ක රට යනවා කිව්ව කතාව නම් බොරුවක්. එයාගෙ සල්ලි දාන්න කියලා තියෙන්නෙ මෙහේ අකවුන්ට් එකකට නිසා එයා අනිවර්යෙ න්ම ලංකාවේ කොහේ හරි තමා ඇත්තේ.

ඒකනේ මම කිව්වේ. එයාට වෙන කොල්ලෙක් නැහැ කියලා. දැන් අපි කොහෙට්ද යන්නෙ.

අපි දැන් නවතින්න තැනක් හොයාගන්න ඕනේ.

මේ ළග හොටෙල් එකක් තියෙනවා මම දැක්කා. අපි එතනට ගිහින් බලමු.

අර අතන තියෙන හොටෙල් එකද

ආ ඔව, ඒක තමයි.

ඔයා ගිහින් බලලා එනව්ද ඒකේ රූම් තියෙනවද කියලා.

හරි පොඩ්ඩක් ඉන්න මම බලන්නම්.

එහෙම කියපු අරුණී හොටෙල් එක අතුලට ගියා.

මේකේ නවතින්න පුලුවන් අනුත්තර අයේත් ආව අරුණී කිව්වා.

එහෙනම් ඔයා ඉන්න. ගිහින් රූම් දෙකක් බුක් කරන්න. මට පොඩි වඩකට යන්න තියෙනවා.

ඔයා කොහෙද යන්නෙ.

මම ඇවිල්ලා කියන්නම් ඔයා හොටෙල් එකට වෙලා ඉන්න.

# 10

රූම් දෙක බුක් කරලා බඩු ටික ගිහින් තයලා ඉවර වෙලා අරුණි. හොටෙල් එකේ ගාර්ඩ්න් එකට ගියා. පැය දෙකකට විතර පස්සේ අනුත්තර ආවා.

ඔයා කොහෙද ගියේ.

මම සිම් කම්පැණි එකට ගියා. ඒකේ මගේ යලුවෙක් ඉන්නවා. එයාට කියලා මම බැලුවේ අනූගේ සිම් එක තියෙන්නෙ කොහෙද කියලා. අන්තිමට සිම් එක තිබිලා තියෙන්නේ කොලඹ නුවර පාරේ තැනක. ඊට පස්සෙ මම හිතන්නෙ සිම් එක අයින් කරලා.

ඒ කියන්නෙ එයා ගිහින් තියෙන්නේ නුවරටද?

හරියටම කියන්න බැහැ. මමත් හිතුවේ අපි  නුවරට ගිහින් බැලුවනම් හොදයි කියාලා.

නුවරට ගියත් අපි දෙන්නට ඇවිදලා එයාව හොයගන්න එක කරන්න බැරි වැඩක්. අනුත්තර අපි එයා ගැන ෆේස්බුක් එකට දාමුද? මොකකම හරි විස්තරයක් හොයාගන්න පුලුවන් වෙයිනේ.

මගෙ ළග ෆොටෝ තිබුනා මම දාන්නම්.

ඔයාට කොහෙන්ද  අනුගේ ෆොටෝ.

එයා ඉතින් මම ආදරේ කරන කෙනානේ. මගේ ළග එයාගේ ෆොටෝ තියෙනවා.

එයානම් ඔයාට ෆොටෝ දෙන්න නැතුව ඇති. ඔයා කොහොමද එයාගේ ෆොටෝ ගත්තේ.

ඇයි එයා බැල්කනියට වෙලා පාඩම් කරන්නේ. ඒවෙලාවට මම පැය ගානක්  එයා දිහාබලන් හිටියත් එයා දන්නේ නැහැ.

ඒක තමයි ඒ දවස් වල මම වැඩවලට කෝල් ගන්නකොට උත්තර දුන්නත්තේ.

ඔව්, ඒ වෙලාවට ඕවා ඇහෙනවයෑ. අපි දැන් ඇතුළට යමුද.හෙට නුවර යන්න ඕනෙ හින්දා කලින්ම නිදාගත්තොත් හොදයි.

හරි යමු මටත් මහන්සියි දැන්

---

මම දැන් ඩ්‍රයිව් කරන්නද. ඔයාට මහන්සිත් ඇතිනේ.

ඕන නැහැ අරුණී. තවටික දුරයිනේ තියෙන්නෙ.

අපිට ආයෙත් දැන් නවතින්න තැන්ක් හොයාගන්නත් වෙනවා නේද.

නැහැ මම ඊයේ රෑ මෙහේ හොටෙල් එකකට කතා කරලා රූම් බුක් කරා.

එතකොට අපි අනූ ගැන මොකක් හරි විස්තරයක් දැනගන්නකම් හොටෙල් එකට වෙලා ඉන්නවද.

නැහැ. අනූ මෙහේ ආවනම් එයත් නතර වෙන්නේ හොටෙල් එකකනේ. ඒ නිසා අපි මෙහේ තියෙන හොටෙල්වලට ගිහින් අහලා බලමු.

අරුණීයි, අනුත්තරයි හොටෙල් එකට ඇවිල්ලා එයාලගේ බඩු රූම් වලට යැව්වා. ඊට

පස්සේ ඒදෙන්නා දවිල් කෑමට ගියා. දවල් කෑමෙන් පස්සේ ඒ දෙන්නා හොටෙල් වලට ගිහින් අනුරාධා ගැන හොයන්න පටන් ගත්තා. හව්ස් වෙනකම්ම ඇවිද්දත් ඒ දෙන්නට කිසිමා විස්තරයක් හොයාගන්න හම්බුනේ නැහැ.

අන්තිමේටම ගියපු හෝටලෙන් එයාලට අනුරාධා ගැන විස්තරයක් හොයාගන්න හම්බුනා.

ඔව්, මේ කෙනා මෙහෙ තමයි නතර වෙලා හිටියේ.

අපිට දැනගන්න පුලුවන්ද එයා කව්දද මෙහේ හිටියේ කියලා.

එයා ඊයෙයි පෙරේදයි තමා මෙහේ හිටියේ. අද උදේ තමයි මෙහෙන් ගිහින් තියෙන්නෙ.

එහෙමද තැන්ක් යූ විස්තර වලට එහෙම කියලා අරුණියි අනුත්තරයි හොටෙල් එකෙන් එලියට ආවා.

අපි ඊයේ මෙහෙට ආවන්ම් අපිට අනුව හම්බුවෙනවා. ආයෙත් හොටෙල් එකට යන ගමන් අනුත්තර කිව්වා.

ඔව්, දැන් අපිට ආයෙත් එයාව මග හැරුනා. මේ පාර එයා කොහෙට ගියාද ද්නනැහැ.

බලමු. අපි ෆේස්බුක් දැම්ම එකට මොකක් හරි විස්තරයක් හම්බුවෙයිද කියලා.

ඔව් ඉතින් අපිට දැන් ඒක විතරයි තියෙන්නෙ.

මම හිතන්නෙ අපි නුවර ඉන්න එක තේරුමක් නැහැ. අනූ ගැන විස්තරයක් හම්බුවෙනක්ම් අපි ආයෙත් බෝඩිමට ගියොත් හොදයි.

ඔව්, ඔයාට තාත්තාගෙන් බැනුම් අහන්න්ත් වෙයි ඔෆිස් එකේ වැඩ නොකර ඉදලා.

ඔව්, එතන මැනේජර්ට කෝල් කරලා මේ ඩව්ස් දෙකේ වැඩ ටිකනම් කරගත්තා. ඒත් අද උදේ තාත්තා කෝල් කරා. ඒ නිසා යන්නම වෙනවා.

හරි එහෙනම් අපි හෙට උදේම යමු. අනූ ගැන විස්තරයක් හම්බුන ගමන්ම අපිට එන්න පුලුවන්නේ.

පහුව්දා උදේ අරුණියි, අනුත්තරයි ආපහු බෝඩිමට ගියා.

කොච්චර මහන්සි වෙලා අනුරාධා ගැන විස්තර හෙව්වත් සති තුනක් යනකම් කිසිම විස්තරයක් හොයාගන්න බැරි වුනා. පොලීසියටත් කිසිම විස්තරයක් හොයාගන්න් බැරි උනා.

අන්තිමේට සති තුනකට පස්සේ අනුරාධා ඉන්නේ කොහෙද කියලා හොයගන්න පුලුවන් විදිහේ තොරතුරක් අනුත්තර්ට හම්බුනා. ඉතින් අනුත්තර අරුණිට කතා කරා.

අරුණි, මට දැන් පොලීසියෙන් කතා කරා.

එයාල මොනවද කිව්වේ. අනූ ගැන විස්තරයක් හොයාගන්න පුලුවන් වෙලද

ඔව්, ඊයේ උදේ එයාගේ අකවුන්ට් එකෙන් සල්ලි අරන් තියෙනවලු නුවර එලියෙදී

ඒ කියන්නේ අනූ ඉන්නවා ඇත්තේ නුවරඑලියේ වෙන්න ඇති.

ඔව්, මම තව පැයකින් බෝඩිමට එනවා. ඔයාට පුලුවන්ද ලැස්ති වෙලා ඉන්න. මම හිතුවේ අදම ගියානම් හොඩයි කියලා.

ඔව්, අදම යමු මම ලැස්ති වෙලා ඉන්නම්.

## 11

අනූ, ඔයාට බෙහෙත් බොන්න වෙලාව හරි.

අනේ අසංක, මට බැහැ ඔය බෙහෙත් බොන්න.

ඔයාට ඔය ලෙඩේ හොද කරගන්න කිසිම උවමනාවක් නැහැනේ.

බෙහෙත් බීව්වා කියලා මේ ලෙඩේ හොද වෙන්නෑනේ.

ඔව් ඔව්, දැන් ඔයා මට වඩා ලෙඩ ගැන දන්නවානේ. කට වහගෙන මේ බෙහෙත් ටික

බොන්න. එහෙම කියලා අසංක මගේ අතට බෙහෙත් ටික දුන්නා. අසංකගේ වදෙන් බේරෙන්න ඕනේ නිසා මම බෙහෙත් ටික බිව්වා.

බෙහෙත් බීලා ඉවර වෙලා මම ඇදේ හාන්සි වෙලා කල්පනා කර කර හිටියා. එතකොට අසංක ආයෙත් කාමරේට ආවා.

මොනවද අනූ ඔයා අච්චර කල්පනා කරන්නෙ.

මොකුත් නැහැ.

මොකුත් නැති වෙන්න බැහැනේ. ඔයා තාමත් කල්පනා කරන්නේ අර අනුත්තර ගැන නේද

එහෙම නැහැ. ඒක නෙවෙයි මට ඔයාගෙන් පොඩි උදව්වක් ඕනේ.

මොකක්ද? කරන්න පුලුවන් උදව්වක් නම් කරන්නම්.

මාව පොඩ්ඩක් ඇවිදින්න එක්ක යන්නකෝ. කාමරේට වෙලා දවස් ගාණක් කාමරේට වෙලා ඉදලා එපා වෙලා.

ඒ උනාට සීතලේ ඇවිදින්න යන එක ඔයාට හොද නැහැ.

මොකක්ද අනේ, ඉක්මනට එමු. මට මෙහෙම ඉදලා එපා වෙලා.

හරි එහෙනම් ලෑස්ති වෙන්නකෝ. මගේ නිවාඩු දවසෙත් ඔයා මට වද දෙනවනේ.

ඊට පස්සේ මම ඇවිදින්න යන්න ලෑස්ති වුනා.ලෑස්ති වෙලා ගිහින් කාර් එකට නැග්ගා.

අස්ංක කියන්නේ මගේ තාත්තාගේ පැත්තෙන් මට නෑයෝ වෙන කෙනෙක්. එයා ඩොක්ටර් කෙනෙක්. මම කොලඹ බෝඩිමේ ඉදලා ඇවිල්ලා නුවර නතර වුනාට පස්සේ අසංක මට කෝල් කරලා මෙහේ එන්න කිව්වා. ඊට පස්සේ මම නුවර එලියට ආවා. ඒත් නුවර එලියේ ආවට පස්සේ මම හඩිස්සියේම අසනීප වුනා. අසංක තමයි දැන් මාව බලාගන්නේ.

අපි හග්ගල ගාර්ඩන් එකට ආවා. පැය දෙක්ක විතර ඇවිදලා ඊට පස්සේ කෑමත් කාලා අපි ආයෙත් ගෙදර යන්න පිටත් උනා.

අපි ගෙදර එන ගමන් අසංක එයාට ඕනේ කරන බඩු වගයක් ගන්න නුවර එලියේ ටවුන් එකේ නතර කරා. මම කාර් එකටම වෙලා ඉන්න අතරේ එයා බඩු ටික ගන්න ගියා.

මම ඔහොම ඉන්න අතරේ තවත් කාර් එකක් ඇවිල්ලා ඉස්ස්ර්හින් නතර කරා. ඒ වෙන කවුරුත් නෙවෙඉ අනුත්තරගේ කාර් එක.

කාර් එකෙන් කවුරුත් එළියට බහින්න කලින්  හොද වෙලාවට අසංක  ආවා. එයා ඉක්මනට වාහනේ පාරට ගත්ත නිසා අනුත්තර මාව ඩකින්න නැතුව ඇති. මාත් ඒ කර් එකේ හිටියේ කවුද කියලා දැක්කේ නැහැ.

හොද වෙලාවට අපි මගේ කාර් එකේ එන්නැතුව අසංකගේ කාර් එකේ ආවේ. නැත්නම් අනුත්තර දැක්ක ගමන්ම අදුරගනියි.

ගෙදර ආවට පස්සේ මම අසංකට මේ ගැන කිව්වා. එයා ඒ ගැන හොයලා බලලා මට විස්තර කරන්නම් කිව්වා.

---

අනුත්තර ටවුන් එකේ කාර් එක නතර කරේ ගොඩක් දුර ඩ්රතයිව් කරන් ඇවිත් මහන්සි නිසයි. ඊට පස්සේ අරුණී ඩ්ර යිවින් සීට් එකට මාරු වුනා. ඒ නිසා එයාලා අනූ කාර් එකේ යනවා දැක්කේ නැහැ.

ඊට පස්සේ අරුණීයි අනුත්තරයි කලින් බුක් කරලා තිබුන හෝටලේට ගියා. කෑම්  කන්න

ආවට පස්සෙ දෙන්නා ආයෙමත් කතාව පටන් ගත්තා.

අපි තාම දන්නේ අනූ මෙහේ ඉන්නවා කියලා විතරනේ  අනුත්තර. එතකොට කොහොමද අපි එයාව හොයගන්නෙ.

මම හිතන්නෙ එයා ඉන්නේ හොටෙල් එකක නෙවෙයි. මොකද දැන් සති තුනක්ම ගිහින් නිසා එයා අනිවාර්යෙන්ම මෙහේ  කාත් එක්ක හරි නතර වෙලා ඇති.

ඒත් එයා නතර වෙනවන්ම් නතර වෙන්නේ කවුරු හරි නෑයෙක් නැත්නම් යාලුවෙක් එක්කනේ. මම දන්න තරමින් එයාට මෙහේ ඉන්න යාලුවෝ නැහැ. මෙහේ කවුරු හරි නෑයෙක් ඉන්නවනම් තමා.

ඔයා දන්නේ නැද්දා එයාගෙ නෑයෝ කවුරුවත් මෙහේ ඉන්නවද නැද්ද  කියලා.

නැහැ අනුත්තර, මම එයාගේ නෑයෝ ටික දෙනෙක් ගැනැ විතරයි දන්නේ.

කොහේ හිටියත් එයාගේ කාර් එක එයා ඉන්න  තැනක ඇතිනේ. මෙහේ ගෙවල් තියෙනෙ පැත්තේ ටිකක් ඇවිදලා බලමු හෙට.

ඔව්, අපි හෙට යමු. දැන් මහන්සියිනේ. මම යනවා රූම් එකට . අපි හෙට උදේ ඉදන්ම හොයමු.

එහෙම කියලා අරුණි රූම් එකට ගියා ඊට පස්සේ අනුත්තරත් රූම් එකට ගියා. අනුත්තර්ගේ එකම ප්රාුර්ථනාව උනේ මෙහෙදිවත් අනූව හම්බුවේව කියන එක.

---

අනූ, එන්න කෑම කන්න යන්න. කම්මැලියි කිය කිය කාමරේට වෙලා ඉන්නවා මිස කන්නවත් එළියට එන්නේ නැහැනේ.

මට කන්න බෑ අසංක අයියා. ඔයා කන්න.

පිස්සු නැතුව මෙහේ එනවා. කන්නැතුව බෙහෙත් බොන්න බැහැනේ.

ඒ වුනාට මට කන්න බැහැ.

ඇයි මොකද කන්න බැරි. අනුත්තරව මතක් උනාද. එයානම් මේ වෙනකොට කාලා ඇති.

වෙන්න ඇති. ඇයි දන්නෑ එයා මෙහේ ආවේ.

එයා එන්න ඇත්තේ අරුණිත් එක්ක. ඔයා කිව්වේ අරුණිත් අනුත්තරට කැමතියි කියලා.

දැන් ඒ දෙන්නා යාලු වෙලා ඇති. අසංක අයියා එහෙම කියනකොට මගේ ඇස් දෙකට කඳුලු පිරුනා.

මම ගෙදරට කියලා ආවේ මගේ බෝයිෆ්රෙන්ඩ් එක්ක රට යනවා කියලනේ. කොහොමත් අනුත්තර මේ වෙනකොට ඒක දැනගෙන ඇති. එහෙනම් ඉතින් අනුත්තර මේ වෙනකොට අරුණිගේ ආදරේ බාරගෙන ඇති.

අසංක අයියා මට කියලා කියලා බැරිම තැන යන්න ගියා. මම එහෙම්ම නිදාගන්න ආවා. කෑවෙත් නැහැ, බෙහෙත් බිව්වෙත් නැහැ.

පහුවදා උදේ මම නැගිට්ටිනකොටත් අසංක අයියා වැඩට ගිහින්. වැඩට ඉන්න කුසුමා නැන්දා විතරයි හිටියේ. උදේටත් හරියට කෑවේ නැහැ.මොන දේ කරන්න ගියත් මතක් වෙන්නේ අනුත්තරව. කෑවේ  නැති නිසා මම බෙහෙත් බිව්වෙත් නැහැ.කොහොමත් හොද වෙන්නැති ලෙඩකට මම බෙහෙත් බොන්නේ මොකටද?

කුසුමා නැන්දා දවස් තුනකට නිවාඩු ඉල්ලගත්තා කියලා දවල් වෙලා ගියා. එයා ගියාට පස්සේ මම ඇඳට වෙලා කල්පනා කර කර හිටියා. එහෙම්ම මට නින්ද ගිහිල්ලා. හවස අසංක අයියා

ඇවිල්ලා ඇහැරවනකොට තමයි ඇහැරුනේ. ඒ වෙනකොට ගොඩක් හවස් වෙලා.

අසංක අයියා, අද ඔයාට එන්න වෙලා ගිහින් නේද?

ඔව් අනේ, මගදි කාර් එක කැඩුනා. ඒක හඩන්නත් දාලයි ආවේ. හෙට ඉතින් මට ඔයාගේ කාර් එක තමයි අරන් යන්න වෙන්නෙ. කමක් නැහැනේ.

ආ, ඒකට කමක් නැහැ. කොහොමත් මට කොහෙවත් යන එක ඔයා තහනම් කරලනේ තියෙන්නෙ. යතුර ඇති ඔය කණ්ණාඩි මේසේ ළග.

හරි මම යන්නම්. දැන් ඉතින් මගෙන් ගුටි කන්නේ නැතුව කෑම කන්න යමු. මම අද කඩෙන් කෑම ගෙනාවා. කුසුමා නැන්දා මේ ටිකේ නැහැනේ.

අසංක අයියාගේ කරදරේ නිසාම මම කෑම කන්න ගියා. කෑම කාපු ගමන්ම මම ආයෙත් කාමරේට ආවා.

# 12

පහුවදා උදේ ඇහැරෙනකොට  අසංක අයියා ගිහිල්ලා. එයාගේ කාර් එක කැඩිලා නිසා එයා මගේ කාර් එක අරගෙන වැඩට ගිහිල්ලා.

කවුරුත් ගෙදර නැති නිසා මම ඉදගෙන නවල්  එකක් කියවන්න පටන් ගත්තා. ගෙදර ඉතින් කතා කරන්නවත් කවුරුත් නැහැනේ. ඔය අතරේ මම කල්පනා කලේ අනුත්තර ගැන. එයා මෙහේ ආවේ අරුනි එක්කනම් සමහරවිට එයා අරුණිට කැමති වෙලා ඇති. ඒත් මම අරුණි කාර් එකේ හිටියද කියලානම්  දැක්කේ නැහැ.

ඒත් අනුත්තර ආවේ තනියමනම් එයා මොකටද නුවර එළියේ එන්නේ. මම ඉන්නේ මෙහේ

කියලා එයා දැනගනවත්ද. මම ඔහේ ඉදගෙන මේ ගැන කල්පනා කර කර ඉදලා කාමරේට ගියා.

එකපාරටම ඔලුව රෙදෙන්න ගත්ත නිසා මාම ඇද්ට ගියා. ටිකක් වෙලා යනකොට මට නින්ද ගිහිල්ල. දවල් වෙලා මම ඇහැරුනේ මගේ ෆෝන් එක රින්ග් වෙනවා ඇහිලා. වෙන කවුද ඉතින් ඒ අසංක අයියා ඇර. එයා ළග විතරනේ මගේ නම්බර් එක තියෙන්නෙ.

හලෝ, කියන්න ඇයි කතා කලේ.

මොකද අනූ කෝල් කරාම උත්තර දෙන්න බැරි. මම කෝල් කීයක් ගත්තද.

සොරි අනේ, මම නිදාගෙනයි හිටියේ. මට ඇහුනේ නැහැ. ඇයි ඔයා කෝල් කරේ.

කාලා බෙහෙත් ටික බිව්වද අහන්නයි කෝල් කරේ.

ඔව්, බෙහෙත් බිව්වා. මම අසංක අයියට බොරුවක් කිව්වා.

එතකොට ඇයි නිදාගත්තේ.

මගේ ඔලුව රිදෙනවා ඒකයි නිදාගත්තේ.

එහෙනම් ඔයා නිදාගන්න. මම දැන් තියන්නම්. අද ටිකක් වැඩ වැඩියි. සමහරවිට අද එනකොට රෑ වෙයි. කාලා බෙහෙත් ටික බොන්න හොදද.

හරි එහෙනම් තියන්න බායි.

---

අනුත්තරයි අරුණියි දවස පුරාම ඇවිද්දත් අනූ ගැන කිසිම විස්තරයක් හොයාගන්න පුලුවන් උනේ නැහැ.

මේ අතරේ අරුණිට උනත් හැදුනා.

මට මේ පලාතේ සීතල එච්චර හරියන්නෑ අනුත්තර. ඒකයි මේ උණ.

එහෙනම් ඉතින් ඔයා ආපහු යන්න. මම අනූව හොයගන්නම්.

එහෙම හරියන්නෑනේ අනුත්තර. මාත් ඔයා  එක්ක අනූ හොයන්න ඉන්න ඕනේ. බෙහෙත් ගත්තනම් මේක අඩුවෙයි.

හරි එහෙනම්, අපි දැන් හොස්පිටල් එකට ගිහින් එමු.

ඊට පස්සේ අරුණියි අනුත්තරයි ඉස්පිරිතාලෙට ගියා. කාර් එක පාර්ක් කරන්න ඉඩ

නොතිබුන නිසා ඩොක්ටර්ස්ලගේ කාර් පාර්ක් එකට කාර් එක දාන්න කියලා එතනින් කිව්වා. ඒ නිසා අරුණිව බස්සලා බෙහෙත් අරන් එන්න කියලා අනුත්තර කාර් පර්ක් එකට වෙලා හිටියා.

එතකොටයි අනුත්තර දැක්කේ අනූ ගේ කාර් එක එතන තියෙනවා.

අරුණි බෙහෙත් අරන් එනවත් එක්කම පිටිපස්සෙන් අසංකත් ආවේ හදිස්සියේ ගෙදර අමතක වෙලා ආපු ෆයිල් වගයක් ගන්න ගෙදර යන්නයි.

අරුණි ඇවිත් කාර් එකට නගිනකොට අනුත්තර බලාගෙන හිටියේ අනූ ගේ කාර් එකට නගින අසංක දිහා. ඒ වෙනකොට අරුණිත් මේ සිද්ධිය දැකලයි හිටියේ.

අනුත්තර ඒ අනූගේ කාර් එක නේද? ඒත් ඒකට නැග්ගේ ඩොක්ටර් කෙනෙක්නේ.

ඒක තමයි මාත් බැලුවේ. අපි ඒක පස්සෙ ගිහින් බලමු කොහෙටද යන්නෙ කියලා.

ඊට පස්සේ අනුත්තර අසංක පස්සෙන් ගෙදර ළගටම ආවා. අසංක කාර් එක අතුලට

හරවනකොට අනුත්තර ඒ ළගම පාරේ කාර් එක නවත්තගෙන බලන් හිටියා.

අසංක ආයෙත් ඉක්මනින්ම යන හැටි අනුත්තර බලන් හිටියා.

මම හිතන්නේ අනු මෙහේ වෙන්න ඇති ඉන්නේ.

ඒත් අරුණි කවුද අර කොල්ලා. ඔයා කලින් දැකලා තියෙනවද ඒ කොල්ලව.

නැහැ. මම දන්නෑ ඒ කොල්ල කවුද කියලා.

අනු ඉන්නෙ මෙහෙනම් එයා මේවෙලාවේ ගෙදර ඇති.

එහෙනම් අපි ගිහින් කතා කරමුද?

ඔව් යමු. අර කොල්ලා ආපහු එන්න කලින් ගිහින් බලමු.

ඊට පස්සේ අරුණියි අනුත්තරයි කාර් එකෙන් බැස්සා.ඊළගට ඒ දෙන්නා ගේට්ටුවෙන් අතුළ්ට ගිහිල්ලා බෙල් එක ගැහුවා.

අසංක අයියා ගෙදරට ඇවිත් කතා කරද්දී නිදාගෙන හිටපු මට ඇහැරුනා. දවස් දෙකක් බෙහෙත් බිව්වේ නැති නිසා දැන්නම් ඇගට ටිකක් අමාරුයි වගේ. ඒත් ඒක අස්ංක අයියට පෙන්නන්නැතුව මම ඇදට වෙලාම හිටියා.

අසංක අයියා ගියාට පස්සේ මම ඇදෙන් බැස්සා. ඒත් එක්කම වගේ මගේ ඔලුව කැරකෙන්න පටන් ගත්තා. ඇමාරුවෙන් පහලට බහින්න පඩිපෙළ ළගට ගියා. එතකොටම වගේ ගෙදර බෙල් එක ගහන සද්දේ මට ඇහුනා.

කවුද කියලා බලන්න පල්ලෙහාට යන්න පඩි දෙකක් බහින්න හම්බුනේ නැහැ. එකපාරටම කැස්සකුත් එක්ක නහයෙන් ලේ එන්න පටන් ගත්තා. මුලු ඇගම පිච්චෙනවා  වගේ දැනෙද්දී කටෙනුත් ලේ එන්න පටන් ගත්තා. ඒත් එක්කම මට සිහිය නැති උනා.

මේ අතරේ අනුත්තර කිහිප සැරයක්ම බෙල් එක ගැහුවත් කවුරුවත්ම දොර අරින්න ආවෙ නැහැ.

අනූ මෙහේ නෑ වගේ නේද අරුණි.

එහෙම වෙන්න බැහැනේ. අනුගේ කාර් එක තියෙන කොල්ලා ඉන්නෙ මෙහෙනම් අනූ ඉන්න ඕනේ මෙහෙනේ.

අනූ කාර් එක විකුනලාවත්ද දන්නැහැ.

එහෙම වෙන්න බෑ අනුත්තර මම හිතන්නෑ එයා එහෙම කරයි කියලා. පොඩ්ඩක් ඉන්න මම අර ජනේලෙන් බකන්නම් ඇතුළ් ජේනව්ද කියලා. එහෙම කියලා අරුණි ජ්නේලේ ගාවට ගිහින් ඇතුල බැලුවා. දැකපු දෙයින් අරුණිට කෑගැස්සුනා.

එතකොට අනුත්තරත් එතනට ඇවිල්ලා ජනේලෙන් ඇතුළ  බැලුවා. දැක්ක දෙ අනුත්තරටත් හිතාගන්න බැරි වුනා.

ඒත් එක්කම දොර ගාවට දුවපු අනුත්තර දොර අරින්න උත්සාහා කලා. අන්තිමේට අනුත්තරට දොර ඇරගන්න පුලුවන් උනා. දොර ඇරපු ගමන් අරුණියි අනුත්තරයි දුවගෙන ගියේ පඩිපෙළ  පාමුල ලේ  ගොඩක්  මැද  වැටිලා හිටපු අනූ ගේ ගාවට. ඒ වෙනකොට අනූ ට සිහිය නැති වෙලයි හිටියේ.

අනුත්තර එයාට සිහිය නැතිවෙලා. අපි මෙයාව ඉක්මනට හොස්පිටල් එකට අරන් යමු.

ඊට පස්සේ  අනුත්තර  ලේ ගොඩක් මැද වැටිලා හිටපු අනූව උස්සා ගත්තා.අරුණීට කාර් එකට නගින්න කියලා අනූ ව අරුණීට අල්ල ගන්න කිව්වා. ඊට පස්සෙ අනුත්තර ඩ්‍රරයිව් කරන්න ගියා.

දෙවියනේ අනූට මොකක්ද මේ වෙලා තියෙන්නෙ.

මට පේන්නේ එයාගෙ ඔලුව පැලිලා වගේ අනුත්තර. ඒත් එයාගේ නහයෙනුයි කටිනුයිත් ලේ ගිහිල්ල තියෙනවා.

එයාගෙ ඔලුව පැලිලානම් අර කොල්ලා මොනවා හරි කරලද දන්නැහැ.

මම හිතන්නෑ , අනූ ඉන්නේ ඒ කොල්ලා එක්කනම් ඒ කොල්ලා මොකටද අනූට මෙහෙම කරන්නේ. වෙන මොකක් හරි නිසයි අනූට මෙහෙම වෙලා තියෙන්නෙ.

ඒ වුනාට මට ඒ කොල්ලව විශ්වාස නැහැ. අනූව ගෙනිච්ච ගමන් අපි ඒ කොල්ලව හොයාගන්න ඕනේ.

ඔව්, එයාව අනිවර්යෙ න්ම හොයාගන්න වෙයි. අරුණී එහෙම කිව්වේ අනූගෙ අතේ තිබුන මුද්ද දැකලයි. අනුත්තර මුද්ද දැක්කොත් මොකද

වෙන්නේ කියලා දන්න නිසා අරුණි අනූ ගෙ අතේ තිබුන මුද්ද ගැලෙව්වා.

අරුණියි අනුත්තරයි අනූ ව ඉක්මනට ඉස්පිරිතාලෙට අරගෙන ගියා. අනූ ව ඉක්මනටම ඔපරෙශන් තියටර් එකට් ගෙනිච්චා. අරුණිට එතනට වෙලා ඉන්න කියපු අනුත්තර අසංකව හොයාගෙන ගියා.

අන්තිමට අසංකව හොයගත්ත අනුත්තර අසංකව ඔපරේශන් තියටර් එක ළගට ඇදගෙන ආවා.

තමුසේ දැන් කියනවා මොනවද මෙගේ අනූට කරේ කියලා.නැත්නම් මම තමුසෙව ඉතුරු කරන්නෑ.

මොකක්ද? මොනව්ද ඔයා කියන්නෙ? මම අනූට මොනවද කරේ? අනික තමුන් කවුද?

අනුත්තර සන්සුන් වෙන්න. මම ඔයාට කිව්වනේ, අනූට එහෙම වෙන්න ඇත්තේ මෙයා නිසා නෙවෙයි කියලා.

අරුණි කට වහගෙන ඉන්න. ඔයා කොහොමද කියන්නෙ මෙයා නෙවෙයි අනූට එහෙම කලේ කියලා.

අනූට මොනවද වෙලා තියෙන්නේ. ඔය දෙන්නා මොනවද ඔය කියවන්නෙ. එතකොට ඔයා අනුත්තර අනූට ආදරේ කරප්පු කෙනාද.

තමුන් දන්නෙම නෑ අනූට මොකද වෙලා තියෙන්නේ කියලා. අනික තමයි, මම අනූට ආදරේ කරපු කෙනා නෙවෙයි තාමත් ආදරේ කරන කෙනා, ඒක මතක තියාගන්නවා.

අනුත්තර පොඩ්ඩක් සන්සුන් වෙන්න. මෙයා දන්නේ නැතුව ඇති අනූට මොකද වෙලා තියෙන්නේ කියලා.

අනූට මොක්ද වෙලා තියෙන්නේ. ඔයා අරුණි, ඔයාවත් කියන්න අනූට මොක්ද වෙලා තියෙන්නෙ.

අපි එහෙට යනකොට අනූ ලේ ගොඩක් මැද වැටිලයි හිටියේ. එයාගේ ඔලුවත් පැලිලා. නහයෙනුයි කටිනුයිත් ලේ ගිහිල්ලා අපි එයාව මෙහෙට අරන් ආවා. එයා දැන් ඔපරේශන් තියටර් එකට ගත්තා.

දෙවියනේ, මම ගෙදර යනකොටත් එයා හොඳට හිටියනේ.

## 13

ඒ වෙලාවේ ඔපරේශන් තියටර් එකේ ඉදලා ඩොක්ටර් කෙනෙක් එලියට ආවා.

ඩොක්ටර් අසංක. අනුරාධා කියන්නෙ ඔයාගේ වයිෆ් නේද? එයගේ තත්ත්වේ නම් ගොඩක් බරපතලයි.අපිට එයාව අයි.සී.යූ. එකට දාන්න වෙනවා.

ඒ  කියන්නේ එයාගේ ජීවිතේ බේරගන්න බැරි වෙයිද. ඒත් කලින්නම් එයා හොද කරන්න පුලුවන් තත්ත්වෙකනේ හිටියේ.

මම හිතන්නේ එයා දවස් දෙක තුනක්ම බෙහෙත් බීලා නෑ. එයාට සිහිනැති වෙලා වැටෙන්න ඇති. එයාගෙ ඔලුව පැලිලා තියෙන්නෙ ඒ නිසයි.අනික එයාගෙන් ගොඩක් ලේ ගිහින්.

එයාව බේරගන්න පුලුවන් වෙයිද? අරුණී ඇහුවා.

ඒ ගැන අපිට තාම කියන්න බැහැ.අපි බලමු.

එතකොට අනූ අසංකගේ වයිෆ් ද තමන්ට ඇහුන දේ විශ්වාස  කරන්න බැරුව අනුත්තර එතන තිබුන පුටුවක ඉදගත්තා. ඒක අනුත්තරට කොහොමටවත් දරාගන්න බැරි දෙයක් උනා.

අරුණී අනූ ගේ මුද්ද අසංකගේ අතට දුන්නා. ඊට පස්සේ එයා අනුත්ත්රංගේ ළගට ගියා.

අනුත්තර අපි යමු. ඔයා මෙතන හිටියොත් ඔයාගේ දුක වැඩි වෙන එක විතරයි වෙන්නේ.

බැහැ අරුණී, මට අනූව බලන්නැතුව යන්න බැහැ. මට දැනගන්න ඕනේ ඇයි එයා මෙහෙම කලේ කියලා. මොක්කද එයාට මෙච්චර ඉක්මනට බදින්න තිබ්බ වුවමනාව.

එයාට මොකක් හරි හේතුවක් තියෙන්න ඇතිනේ. දැන්වත් එයා ගැන හිතන එක නවත්වන්න.ඔයා ගැන කිසිම ගානක් නැති කෙනෙක් වෙනුවෙන් ඔය තරම් විදවන්නෙ ඇයි?

කට වහගෙන ඉන්න අරුණි. මට මගේ පාඩුවේ ඉන්න දෙන්න. ඔයාට ඉන්න බැරිනම් මෙතනින් යන්න.

අසංක අනුට මොකක්ද තිබුන ලෙඩේ. එයාගේ ජීවිතේ බේරගන්න බැරි වෙන තරමට අමාරු ලෙඩක්ද? අරුණි ඇහුවා. අසංක අනුත්තර ළගට ගිහින් ඉදගත්තා. ඒ වෙනකොට අනුත්තර ඔලුව බිත්තියට හෙත්තු කරගෙන උඩ බලාගෙනයි හිටියේ. එයාගේ ඇස්වල කදුලු පිරිලා තිබුනා.

අනුත්තර මේ අහන්න මට ඔයාට....

අසංක මට තමු  කියන කිසිම දෙයක් අහන්න ඕනේ නැහැ. ඔයා අනුව බැන්දනම් එයා මැරෙන්න යනකම් ඇයි බලන් හිටියේ.

අනුත්තර ඔය දුක මට තේරෙනවා. අනු මැරෙන්න යනකම් මම බලාගෙන හිටියේ නැහැ. එයාගේ ජීවිතේ බේරෙයිද නැද්ද කියන එක අපිටවත් තීරනය කරන්න බැහැ. එයාට කැන්සර් එකක් තියෙන්නේ.

මේ කතාව ඇහුවට පස්සෙ අනුත්තර්ට එයාගේ කඳුලු තවත් හිර කරගෙන ඉන්න පුලුවන් උනේ නැහැ.

එයා එහෙන් ආවට පස්සේ එයා මට කතා කරලා ඉන්න තැනක් හොයලා දෙන්න කිව්වා. ඊට පස්සේ මම එයාව මෙහාට ගෙන්න ගත්තා. මෙහෙට ආවට පස්සේ එයා අසනීප වෙලා සිහිනැති වුනා. එතකොට තමයි දැනගත්තේ එයාට කැන්සර් එකක් තියෙනවා කියලා. ඒ වෙනකොටනම් එයාව හොද කරන්න පුලුවන් තත්තවෙක තිබුනේ. අන්තිමේට එයා ගිය දව්ස් ටිකේ බෙහෙත් බීලා නැහැ. එයා මට හොරෙන් බෙහෙත් ටික  විසි කරලා.

ඒත් මොකක්ද තමුන්ට  අනූව බදින්න තිබ්බ වුවමනාව. එයා ඔයාව කලින් ඉදලම දන්නවද.එයා මට ආදරේ කරනවනම් ඇයි ඔයාව බැන්දේ.

ඔව් අසංක, එයා ඇයි මෙච්චර ඉක්මනට් බැන්දේ. අනික එයා ඔයත් එක්ක කිසි සම්බනධයක් තිබුනා කියලා මම දැනගෙන හිටියේ නැහැ. එයාගෙ හැම විස්තරයක්ම මම දැනන් හිටියා.

ඒ ගැන මගෙන් අහන්න එපා. අනූ කරන දේවල් ගැන එයාගෙන්ම තමයි අහන්න ඕනේ. අනීක

දැන් ඔයාල මෙතන හිටියා කියලා අනූව බලන්න හම්බුවෙන්නැහැ. එයාගෙ තත්ත්වේ හොද අතට හැරෙනකම් එයාව බලන්න දෙන්නේ නැහැ. ඒ නිසා ඔයාලා දැන් අපේ ගෙදරට යන්න. අනූව බලන්න ඉන්නවනම් ඒකට ටික දවසක් යයි. ඒ නිසා ඔයාල ගෙදරට යන එක හොදයි.

ඊට පස්සේ තුන් දෙනාම ගෙදරට ගියා. හොටෙල් එකේ තුබුන බඩු ටිකත් අරුණී ගෙන්න ගත්තා. ගෙදරට ගිය අනුත්තර අනූ හිටපු කාමරේට ගියා.ඇදෙන් ඉදගෙන ඔලුව බිත්තියට තියාගත්ත අනුත්තර මේ වෙනකම් හිතේ හිර කරන් හිටපු දුක කඳුලු වලට හැරෙව්වා.

ටික වෙලාවකින් අරුණී කාමරේට ආවේ අනුත්තරව කෑම කන්න එක්ක යන්නයි. ඒත් ඒ වෙනකොට අඩ අඩා හිටපු අනුත්තරට එහෙම්මම නින්ද ගිහිල්ලා. ඒ නිසා අරුණී තනියමම කෑම කන්න ගියා.

කෑම කෑවට පස්සේ අසංක ආයෙමත් ඉස්පිරිතාලෙට ගියා. කරන්න වැඩක් නොතිබුන නිසා අරුණී ඉදගෙන නවල් එකක් කියවන්න පටන් ගත්තා. ඒත් ටිකකින් අරුණීටත් නින්ද ගියා. අරුණීට ආයෙමත් ඇහැරුනේ ෆෝන් එකක් රින්ග් වෙන ස්ද්දේ ඇහිලා. ඒත් ඒ එයාගෙ ෆෝන් එකනම්

නෙවෙයි. බලනකොට අසංක එයාගේ ෆෝන් එක දාලා ගිහිල්ලා. ෆෝන් එක ළගට ගියපු අරුණි කෝල් එක ඉවර වෙනකම් බලන් හිටියා. එතකොටයි අරුණි දැක්කේ අසංකගේ ෆෝන් එකේ ඩිස්ප්ලේ එකට දාලා තියෙන ෆොටෝ එක. ඒ ෆොටෝ එකේ අසංක එක්ක හිටියේ වෙන කෙල්ලෙක්.

මේ ෆොටෝ එක දැක්කම අරුණිට කිසි දෙයක් හිතාගන්න බැරි වුනා. අසංක අනූ ව බැන්දනම් එයා මොකටද වෙන කෙල්ලෙක් එක්ක ඉන්න ෆොටෝ එක්ක් දාගෙන ඉන්නෙ. අසංක ආවම මේ ගැන අහන්න ඕනේ කියලා අරුණි තීරනය කරා.

එතකොටම අනුත්තරත් පල්ලෙහාට ආවා. අඩලා අඩලම අනුත්තරගේ ඇස් දෙක රතු වෙලා තියෙන හටි අරුණි දැක්කා. අනුත්තර තවත් හිතින් විදවන්න ඔනේ නැති නිසා අරුණි අනුත්තර්ට ෆෝන් එකේ තිබ්බ ෆොටෝ එක පෙන්නුවා.

මට නම් මේ කිසි දෙයක් තේරෙන්නෑ අරුණි. මගේ ඔලුව හොදටම රිදෙනවා. අසංකයි අනූයි බැදලා නැත්නම් අසංක කියන්නේ අනූගේ කව්ද?

අනේ මන් දන්නෑ, මටත් කිසිම දෙයක් තේරෙන්නෑ. අනූගෙ අතේ මුද්දකුත් තිබුනනේ.

අනූ බැදලා නැතත් එයාගේ කැන්සර් එක නිසා එයා ජීවත් වෙයිද කියලා කියන්න බැහැනේ. එයා වෙන කෙනෙක්ව බැදලා හරි ජීවත් වෙන්න ලැබුනොත් එයා මැරෙනවට වඩා හොදයි. එතකොට අඩුම තරමේ මගේ ආදරේ කොහේ හරි සතුටින් ඉන්නවනේ.

මම හිතන්නෙ අසංකයි අනූයි කරන්නෙ බොරුවක්. එයාලා බැන්දේ ඇයි ඇහුවමත් එයා කිසි උත්තරයක් දුන්නේ නැහැනේ. කතාව වෙනස් කරපු එකනේ කරේ.

ඇයි දෙයියනේ මටම මෙහෙම වෙන්නේ ඇයි හැම ආත්මෙම මට එයාව නැති වෙන්නේ. ඇයි එයා තේරුම් ගන්නැත්තේ මම හැම ආත්මෙකම ආදරේ කරේ එයාට මිසක් ඔයාට නෙවෙයි කියලා.

හ්ම්, අපි අසංක ආවාම එයාගෙන්ම අහලා බලමු.මොකක්ද ඇත්ත කියලා.

---

අනූ හිටපු තත්ත්වෙත් එක්ක එයා හොද අතට හැරෙන්න සතියක් විතර ගියා. ඒ සතියට පස්සෙ තමයි අරුණිටයි අනුත්තරටයි අනූ ව බලන්න යන්න දුන්නේ.

## 14

ආයෙත් මේ ජීවිතේ මට මගේ ඇස් දෙක අරින්න පුලුවන් වෙයි කියලා මම හිතුවේ නැහැ. ඒත් මම තාමත් ජීවත් වෙනවා.

ඔලුව උඩ ගලක් තියලා වගේ වේදනාවක් දැනෙද්දී මම ඇස් දෙක අරින්න උත්සාහා කරා. ඒත් ඒක ලේසි නැහැ. අන්තිමේට මම බොහොම අමාරුවෙන් ඇස් දෙක අරිද්දී මගේ ඉස්සරහා හිටියේ කොහොමටවත් බලාපොරොත්තු වුන කෙනෙක් නෙවෙයි.

පිස්සෙක් වගේ මගේ ඇස් දෙක ඉස්සරාහා හිටියේ අනුත්තර. මූන පුරාම රැවුල වැවිලා.

කොන්ඩෙත් පිස්සෙක්ගේ වගේ. ඇස් දෙකත් හොදටම රතු වෙලා. දුකින් පිරිච්චා ඒ ඇස් දෙකෙන් මගේ දිහා බලන් හිටපු ඒ මූන දැක්කම මට කිසි දෙයක් හිතාගන්න බැරි වුනා. මන් ආයෙත් ඇස් දෙක වහගත්තේ ඒ මූන දිහා බලන් ඉන්න බැරි නිසයි.

අනූ, නැගිටින්න අනූ, අනේ කතා කරන්නකෝ. අනුත්තර එහෙම කියනකොට මම තවත් ඇස් දෙක තද කර ගත්තේ ඇස් ඇරියොත් මටත් ඇඩෙන නිසයි. මම දන්නවා, මගේ මේ කැන්සර් එක කවදාවත් හොද කරන්න බැහැ කියලා. ඒ නිසා මට අනුත්තරට ළං වෙලා කවදාහරි එයාව තනි කරලා මැරිල යන්න බැහැ.

ඒ නිසා එයා නොදන්නවා වගේ හැමදේම අමතක වෙලා වගේ හැසිරෙන එකයි දැන් මට කරන්න තියෙන්නෙ. දුකින් වුනත් මට එහෙම කරන්න වෙනවා. මට අනුත්තරව, අරුණිව වගේම අසංක අයියවත් අමතකයි වගේ ඉන්න සිද්ධ වෙනවා.එහෙම නැත්නම් අනුත්තර කවදාවත් මාව අමතක කරන එකක් නැති වේවි. ඒ වෙලවේම ඩොක්ටර් කෙනෙක් ඇවිල්ලා කතා කරනවා ඇහුනා. ඒ නිසා මම ඇස් දෙක ඇරියා.

අනුරාධා  දැන් ඔයාට කොහොමද? ඔයාට මොකක් හරි අමාරුවක් දැනෙනවද? ඩොක්ටර්

එහෙම අහනකොට මම කොහොමෙඉත්තර දෙන්නද් කියලා හිටි්ර්මහාගන්න බැරි වුනා.

මම මේ කොහෙද ඉන්නෙ. එතකොට මේ අය කවුද? මට මොකද වුනේ. ඩොක්ටර් දිහා බලාගෙන මම එහෙම ඇහුවේ අනිත් තුන්දෙනා දිහා බලගෙන හිටියනම් මට එහෙම කියාගන්න බැරි වෙන හින්දා.

ඔයාට මතක නැද්ද  මෙයාලා කවුද කියලා  එතකොට ඔයාට මතක නැද්ද  ඔයාට මොකද වුනේ කියලා.

මට කිසි දෙයක් මතක් වෙන්නැහැනේ. මට මොකද වුනේ. ඔයාලා කවුද? මම අමාරුවෙන් අරුණී දිහා බලලා ඇහුවා.

ඩොක්ටර් අසංක මට පොඩ්ඩක් ඔයත් එක්ක කතා කරන්න ඕනේ. පොඩ්ඩකට එනවද? එහෙම කියපු ඩොක්ටර් එළියට ගියා. අසංක අයියත් ඒ එක්කම ගියා.

අරුණී මගේ ළඟින් ඉදගෙන අතින් අල්ල ගත්තා. අනුත්තර කිසිම දෙයක් හිතාගන්න බැරුව හිටපු තැනම හිටගෙන හිටියා. එයාගෙ කම්මුල දිගේ පහලට ගලාගෙන යන කදුලු මම දැක්කා. මම අරුණී

දිහා බැලුවේ අනුත්තර දිහා බලන් හිටියොත් මටත් ඇඩෙන නිසයි.

අනූ ඔයාට අපිව මතක නැද්ද ? අවුරුදු ගානක් ඔයත් එක්ක හිටපු යාලුවව මතක නැද්ද ?

මම ඔයාව දන්නේ නැහැනේ. අනේ මගේ ඔඅලුවත් රිදෙනවා. ඇයි මට කිසිම දෙයක් මතක් වෙන්නේ නැත්තේ.

මගේ වාසනාවට ඒ වෙලවේ එතනට සේලයින් එක මාරු කරන්න නර්ස් කෙනෙක් ආවා. එයා අනුත්තරටයි අරුණිටයි එලියට යන්න කියපු නිසා මම බේරුනා. තව ටික වෙලාවක් අනුත්තර මෙතන හිටියනම් මම කරන්නේ බොරුවක් කියලා එයා තේරුම් ගන්නවා.

ඊට පස්සෙ මම  අනිත් පැත්ත හැරිලා ඇස් දෙක වහගත්තා. මොකද මම අඩන හැටි කවුරුත් දකින්න ඕනේ නැති නිසා. අනුත්තර මගේ දිහා බලන් හිටපු හැටි මතක් වෙනකොට මගේ දුක තවත් වැඩි වුනා. අනුත්තරව අතාරින්න හිත හදාගන්න කොච්චර උත්සාහා කලත් ඒක කරන්න අමාරු දෙයක් කියලා මම තේරුම් ගත්තා. ඇයි දෙයියනේ මම මැරුනේ නැත්තේ. මේ පිලිකාවෙන්

මැරෙන්න ඉන්න මාව මොකටද ටික කලෙයක් ජීවත් වෙන්න හරි බේරුවේ.

ඩොක්ටර් අනූට මොකක්ද වෙලා තියෙන්නෙ. එයාට අතීතේ අමතක වෙන්න තරම් බරපතල විදිහට ඔලුව වැදිලා තිබුනේ නැහැනේ. එහෙම වෙන්න පුලුවන්ද?

ඒක වෙන්න බැහැ. එයාට අමතක වෙනවනම් අමතක වෙන්න ඕනේ පොඩි කාලයක් තුල දේවල් විතරයි. එයාට සම්පූර්ණයෙන්ම අමතක වෙන තරමට ඔලුව වැදුනානම් එයාගේ ජීවිතේ බේරෙන්නෙ නැහැ. මොක්ද එයාට කැන්සර් එකකුත් තියෙනෙවනේ.

එතකොට එයා මේ බොරුවක්ද කරන්නෙ.

එහෙම වෙන්න ඇති. හැබැයි එයා එහෙම කරනවනම් එයාට ඒකට ලොකු හේතුවක් ඇති. අන්තිමට එයා බෙහෙත් බොන එකත් අතැරලා දාලා තිබුනේ මොකක් හරි හේතුවක් තිබුන නිසානේ. අපි ඒ ගැන හිමීට එයාගෙන් අහගමු. බලෙන් එයාගෙන් කිසිම දෙයක් අහන්න එපා.

එයාගේ කැන්සර් එක හොද කරන්න පුලුවන්නේ.ඒකම ලොකු දෙයක්.

මට තව ප්රොශ්නයක් තියෙනවා. ඔයා කිව්වේ අනූ ඔයාගේ වයිෆ් කියලා නේද? ඒක ඇත්තක් නෙවෙයිනේ.

නෑ ඩොක්ටර්, එයා මගේ නංගි කෙනෙක්. එයාගේ ප්ර ශ්නයක් නිසයි එයා මගේ වයිෆ් වගේ ඉන්නේ.

මේ අතරේ සිද්ධ වෙන කිසිම දෙයක් හිතාගන්න බැරුව හිටපු අනුත්තර කර් එකට ගියා. ඊට පස්සේ එයා වේගෙන් අසංකගේ ගෙදරට යන්න පිටත් වුනා. වේගෙන් ඩ්රනයිව් කරන් යන අනුත්තරව අරුණි දැක්කත් එයාට අනුත්තරව නවත්තගන්න බැරි වුනා.

ගෙදරට ගියපු අනුත්තර අනූගේ කාමරේට ගිහින් දොර වහගත්තා. මේ වෙන කිසිම දෙයක් අනුත්තරට හිතාගන්න බැරි වුනා. අනූ වෙන කෙනෙක්ව බැදලා. ඒ මදිවට එයාට අනුත්තරව මතකවත් නැහැ. දුක නැති වෙනකම් අඩන එක හැරෙන්න කරන්න වෙන දෙයක් අනුත්තරට තිබුනේ නැහැ.

ටික වෙලාවකින් අසංකයි අරුණියි එන සද්දේ  අනුත්තරට ඇහුනා. ඒත් එයා කාමරෙන් එලියට ආවේ නැහැ. අරුණි කාමරේ ළගට ඇවිල්ලා

කන්න යන්න කතා කරත් අනුත්තරට කෑම් කන්න වුවමනාවක් තිබුනේ නැහැ.

අනුත්තරට දරාගන්නම බැරි දේ වුනේ මෙච්චර ආදරේ කරපු තමන්ව අනුට අමතකයි කියපු එකයි. ගිය ආත්මේ වගේම මේ ආත්මෙත් තමන්ට තමන්ගේ ආදරේ නැති වුනා කියලා මතක් වෙද්දී අනුත්තර්ට මැරෙන්න හිතෙනවා. මෙහෙට වෙලා තවත් හිටියොත් තමන්ට මොනවා වෙයිද කියලා හිතාගන්න බැරි නිසා අනුත්තර මෙහෙන් යන්න තීරනය කරා. ඒ නිසා කාමරෙන් එලියට ආපු අනුත්තර අසංකව හම්බුවෙන්න ගියා.

මේ වෙනකොට අසංක හිටියේ එයාගේ කාමරේ. මොකක්දෝ වැඩක් කරන ගමන් අනුරාධාත් එක්ක ෆෝන් එකෙන් කතා කර කරයි ෆෝන් එකේ ස්පීකර් දාලයි තිබුනේ.

අනූ මොකක්ද ඔයා ඔය කරන විකාරේ තේරුම. ඔයාට අතීතේ අමතකයි කියලා අරුණියි අනුත්තරවයි නම් රවට්ටන්න පුලුවන්. ඒත් මාව රවට්ටන්න ඔයාට බැහැ.

මට මෙහෙම කරනවා ඇර වෙන කරන්න දෙයක් නැහැ අයියේ. නැත්නම් අනුත්තර මගෙන් ඈත් වෙන්නෙ නැහැ.

ඔයා කොහොමද ඔය විදිහට හැසිරෙන්නේ. පිස්සු හැදීගෙන එනවද? ඇයි ඔය විදියට අනුත්තරව රවට්ටන්නේ.

අයියා, ඔයා ගෙදර නේද ඉන්නේ. ඔය විදියට කෑ ගහන්න එපා. අනුත්තරට ඇහේවි.

ඇහුනදෙන් මොකද එයත් දැනගන්න ඕනේ ඔයා එයාව  රවට්ටනවා කියලා.

අනේ අයියේ, මම එයාව රවට්ටනවා නෙවෙයි. මම එයාට කියන්නේ මගෙන් ඈත් වෙන්න කියලා. මැරෙන්න ඉන්න මට එයා තවත් ළං වෙන්න ඕනේ නැහැ.

ඔයා ඕනේ දෙයක් කරගන්න. මම අනුත්තරට කියනවා ඔයා මගේ නංගි විතරයි කියලා.

අනේ එහෙම කරන්න එපා. අඩුම තරමේ මම ගෙදර එනකන්වත් එයාට ඇත්ත නොකියා ඉන්න.

හරි බලමුකෝ. එහෙම කියලා අසංක කෝල් එක කට් කරා.අසංකව හම්බුවෙන්න කියලා කාමරේ ළගට ආපු අනුත්තර මේ කතාව අහගෙනයි හිටියේ. අසංක ෆෝන් එක  ස්පීකර් දාලා තිබුන නිසා අනුරාධා කියපු දේවලුත් අනුත්තරට හොදට ඇහුනා.

මේ කතාව ඇහුවට පස්සේ ආයෙමත් මෙහෙ නතර වෙන්න අනුත්තර තීරනේ කරා. 'අනූ ඔයාට ඕනේ  මාවා ඔයාගෙන් ඈත් කරන්නනේ. අපි බලමු ඔයා කොහොමද  එහෙම ඉන්නේ කියලා. මම ඔයාගේ කටින්ම ඇත්ත එලියට ගන්නම්කෝ'. අනුත්තර තනියම හිතුවා.

# 15

තවත් සතියක් ගත වුනාට පස්සේ මට ටිකට් කපන්න පුලුවන් තත්ත්වෙකට හොද වෙලා තිබුනේ නැහැ. කොහොමත් මට කවදාවත් හොද වෙන්නෙත් නැහැනේ. මේ සතියට එක පාරක්වත් අනුත්තර මාව බලන්න ආවේ නැහැ. අරුණි විතරයි ආවේ. අනුත්තර එන්නෙ නැත්තේ ඇයි කියලා මට එයාගෙන් අහන්න බැනේ.

සමහරවිට අනුත්ත මගෙන් ඈත් වෙන්න තීරනේ කරල ඇති. ඒකනේ එයා එන්නේ

නැත්තෙත්. ඒ වුනාට එහෙම හිතද්දිත් ඒක මට දරාගන්න බැරි දෙයක් වුනා.

අසංක අයියා මාව බලන්න ආවත් එයා හිටියේ මාත් එක්ක තරහින් වගේ. වැඩිය මාත් එක්ක කතා කරෙත් නැහැ.

අන්තිමේට එක දවසක් අනුත්තර තනියමම මාව බලන්න ආවා. කොහොමටත් ඒ මූන දිහා බලන් හිටියොත් මට ඇඩෙන නිසා මම අහක බලාගෙන හිටියා.

අනූ, ඔයාට ඇයි මාව මතක නැත්තේ. ඔයාගෙ ආදරේ කොහොමද ඔයාට අමතක වුනේ.

ඔයා මොනවා කියනවද කියලා මට තේරෙන්නැහැ. මම ඔයාට ආදරේ කරා කියලා කියන්නේ ඇයි. මමයි අසංකයි බැදලා නම් මම ඔයාට ආදරේ කරා වෙන්න බැහැනේ.

මම දන්නේ නැහැ. මම දන්න එකම දේ ඔයා මගේ ආදරේ කියන එක විතරයි.

මට ඔයා ගැන එහෙම කිසිම මතකයක් නැහැනේ. මම ඔයාට ආදරේ කරේ නැහැ.

ඇයි ඔය විදියට බොරු කියන්නෙ ඔයා මට ආදරේ කරා. ඔයාට බැහැ මෙහෙම කරන්න.

කිව්වනේ මම ඔයාට ආදරේ කරේ නැහැ කියලා. ඇයි මට මෙහෙම වද දෙන්නේ.

ඒ කියන්නෙ දැන් ඔයාට මාව වදයක්ද. ඔයාගෙන් අන්තිම පාරට අහන්නෙ. ඔයා මට ආදරේද් නැද්ද.

නැහැ. මම ඔයාට ආදරේ නැහැ. මම හිත ගලක් කරගෙන එහෙම කියනකොට අනුත්තරගේ ඇස් වල තිබුන කඳුලු පහලට වැටුනා. එහෙම්ම මගේ මූන දිහා බලන් හිටපු අනුත්තර කිසිම දෙයක් නොකියා යන්න ගියා. එයා යනකොටම වගේ අසංක අයියා ආවා. ඒත් මම දනිස් දෙක උඩ ඔලුව තියාගත්තේ මට ඇඩුන නිසයි.

මෝඩියේ, දුකයි නම් මොකටද අනුත්තරව ඈත් කරන්න දගලන්නෙ. ඔච්චරම ඒ කොල්ලට ආදරේ නම් ඇයි බොරු කරන්නෙ. අනුත්තරට ඇත්ත කියන්න නංගි. ඔයා ඔහොම කරන එකෙන් වෙන්නේ එයයි ඔයයි දෙන්නම නිකන් බොරුවට දුක් විදින එක විතරයි.

මට එහෙම කරන්න බෑ අයියේ,කැන්සර් එක නිසා මම තව ටික කාලෙකින් මැරිලා යයි.ඒ නිසා අනුත්තර දැම්ම ම් මගෙන් ඇත් වෙන එක හොදයි.

ඒත් ඔයාව හොද කරන්න පුලුවන්නම්. එහෙම වුනත් ඔයා කරන්නෙ ඔය ටිකමද?

මාව හොද කරන්න පුලුවන්නම්, මම කවදාවත් අනුත්තරට මෙහෙම දුකක් දෙන්නේ නැහැ.ඒත් මේ කැන්සර් එක හොද කරන්න බැහැනේ.

නැහැ එහෙම නැහැ, ඩොක්ටර් කිව්වා ඔයාගේ කැන්සර් එක හොද කරන්න පුලුවන් කියලා. මාස තුනක් විතර බෙහෙත් බිව්වොත් ඔයාව හොද කරන්න පුලුවන්.

මොනවා, ඔය ඇත්තමද  කියන්නෙ. ඒ කියන්නෙ මට ජීවත් වෙන්න පුලුවන්.

ඔව්, ඔයාට  තවත් අනුත්තරට බොරු කරන්න ඕනේ නැහැ.

එහෙනම්, එයා හෙට ආවම මම එයාට ඇත්ත කියන්නම්. මට නම් හිතාගන්න බෑ මම මැරෙන්නේ නෑ කියලා. ඒත් අරුණි, මට මේ අත්මෙත් එයාගේ ආදරේ නැති කරන්න බෑ.

ඔයා අරුණි ගැන හිතන්න ඕනෙ නැහැ. එයා ගැන මම හිතන්නම්කෝ. හැබැයි ඉතින් ඔයා මට එයාව කැමති කරවලා දෙන්න ඕනේ හරිද?

මොකක් , ඔයා කියන්නෙ ඔයා එයාට කැමතියි කියලද, මම නම් හිතුවේ නැහැ කවී අක්කා ඔයාට අතෑරියට පස්සේ ඔයා වෙන කෙල්ලෙක් ගැන හිතයි කියලා.

හ්ම්, එයා මාව අතෑරියනම් මම මොකටද තවත් එයා ගැන හිත් හිත ඉන්නේ. මටත් කියලා ජීවිතයක් තියෙන්න එපැයි.

එහෙනම් මම ගෙදර ගියාට පස්සේ එයාව කැමති කරවලා දෙන්නම්කෝ.

මගේ හොද නංගියා. එහෙනම් දැන් මම යන්නම්. අදවත් හරියට කෑම කනවා. එහෙම කියලා අසංක අයියා ගියා. මට තියෙන්නෙ කියාගන්න බැරි සතුටක්. අදින් පස්සේ මට සතුටින් ඉන්න පුලුවන්.

---

අනේ මන්දා අරුණි, අනූ මොකටද මේ විදිහට බොරු කරනවද කියලා.

ඔයා අද එයාව බලන්න ගියානේ. එයා මොක්ද කිව්වේ.

එයා කියන්නේ අයා මට ආදරේ නැහැ කියලා.ඒ වුනාට එහෙම කියනකොට එයාගේ ඇස් වල කඳුලු පිරිලා තිබුනා.එයා නිකමටවත් මගේ මූන දිහා හරියට බැලුවේ නැහැ.

මම හිතන්නේ එයා එහෙම කරන්න ඇත්තේ කැන්සර් එක නිසා මැරෙන්න හිටපු නිසා වෙන්න ඇති. එයා කැමති නෑ ඔයා එයාට ළං වෙලා දුක් විදිනවට.

එහෙම කිව්වට දැන් මම ඊටත් වඩා විදවනවනේ. මම දන්නවා දැන් එයාගේ කටින්ම ඇත්ත කියවගන්නේ  කොහොමද කියලා.

ඔයා මොකකද කරන්න හදන්නේ.

ඔයත් හෙට මාත් එක්ක එයාව බලන්න යමු. හැබැයි මම උදේ තනියම ගිහින් එන්නම්. ඔයා දවල්ට මාත් එක්ක එන්නකෝ.

ඔයා මොකක්ද කරන්නේ කියලා මට නම් තේරෙන්නෑ. ඔයයි අනූයි දෙන්නම් එකයි. කරන්නෙම පිස්සු වැඩ.

අපි බලමුකෝ. හෙට එයාට  මගේ ඉස්සරහා අඩන්නැතුව ඉන්න පුලුවන් වෙයිද කියලා

රෑ පුරාම මට හරියට නින්ද ගියෙත් නැහැ. අනුත්තරට ඇත්ත කියනකම් මට ඉවසිල්ලක් තිබුනේ නැහැ. අසංක අයියනම් කිව්වෙ එයා උදේම මාව බලන්න එයි කියලා.

මම ඇඳේ අනිත් පැත්ත් හැරිලා ඇස් දෙකත් වහගෙන හිටියේ. ටික වෙලාවකින් කවුරු හරි එන සද්දේ මට ඇහුනා. ඇස් වහගෙන හිටියත් ඒ ආවේ අනුත්තර කියලා මට දැනුනා. එයා හිතන්න ඇති මම නිදි කියලා. මමත් ඒ විදිහටම හිටියා. ඇඳ ළගට ආපු අනුත්තර මගේ ළගින් ඉදගත්තා.

අනූ, මට මේ දේවල් තවත් දරාගන්න බැහැ. ඔයා මාව අතෑරලා අසංකව බැදලා. ඒ මදිවට ඔයාට මාව මතකවත් නැහැ. ඔයාට මම ගැන කිසිම ගානක් නැද්ද අනූ. මට නම් මේ දුක තවත් ඉවසන්නා බැහැ. ඔයාගේ සතුට මේකනම් මම යන්නම් ඔයාට සතුටින් ඉන්න දීලා. මේ වදකාරයා ආය ඔයාට වද දෙන්න එන්නේ නැහැ. දුකින් උනත් මම අද තීරනයක් ගත්තා. අරුණිත් මට ආදරේ කරලා දුක් විදිනවා. මම අද අරුණිව බදිනවා අනූ. මම හිතනවා ආයෙත් ඔයාට අතීතේ මතක් වුන දවසක ඔය්යාව මට සමාව දෙයි කියලා.

අනුත්තර එහෙම කිව්වට පස්සේ නිකම් ඔලුව ඇතුලේ අකුණක් ගැහුවා වගේ වුනා. එයා මේ

මොනවද කියන්නෙ. කිසි දෙයක් හිතගන්න බැරි වුන මම ඇස් දෙක අරින්නත් කලින් එයා යන්න ගියා. මේ මොකක්ද මේ වෙන්න යන්නෙ. අනුත්තර අරුණිව බදිනවා කිව්වේ ඇත්තටමද? දෙවියනේ ආයෙත් මට අනුත්තරව නැති වෙන්නද යන්නෙ.

මම නැගිටලා දනිස් දෙක උඩ ඔලුව තියාගෙන අඩන්න පටන් ගත්තා. ඒ වෙලාවේ අසංක අයියා එතෙන්ට ආවා. මම ආයෙත් අඩ  අඩ ඉන්න හැටි දැකලා එයාට මොකුත් හිතාගන්න බැරි වෙන්න ඇති.

අනූ මොකද වුනේ, ඇයි මේ ආයෙත් අඩන්නෙ.දැන් අනුත්තර ඇවිත් ගියානේද ඔයාව බලන්න.

ඇනේ අයියේ. මොකක්ද් මේ වුනේ. ඇයි දෙයියනේ හැමදාම මටම මගේ අය නැති වෙන්නෙ.

අනූ මොකක්ද වුනේ කියන්න. අනුත්තර මොනවද් කිව්වේ.

අයියේ, අනුත්තර අද අරුනිව බදිනවලු. එයා දැන් මට එහෙම කියලයි යන්න ගියේ.

මොකක්. අනුත්තර අරුණිව බදිනවා. එහෙම වෙන්නේ කොහොමද?

අනේ අයියේ එයාව නවත්තන්නකෝ. මම හිතුවේ නැහැ මෙහෙම වයි කියලා.

ඔයාගේ මෝඩකම් හිනදා තමා මේ ඔක්කොම. ඉන්න මම ගෙදරට කෝල් කරලා බලන්නම්.

ඊට පස්සේ අසංක අයියාගෙදර්ට කෝල් කරා. ඒත් අනුත්තර වගේම අරුණිත් ගෙදර හිටියේ නැහැ. මම හීනෙකින්වත් හිතුව ඩෙයක් නෙවෙයි මේ සිද්ද වුනේ. අනුත්තරගෙයි අරුණිගෙයි ෆෝන් දෙකත් ඕෆ් කරලා. මම අඩන එක නවත්තන්නැති නිසාද කොහෙදෝ අසංක අයියා මට බෙහෙතුත් එක්ක නින්ද යන්න බෙහෙත් දීලා. ආයෙත් මට ඇහැරුනේ දවල් වෙලා.

# 16

මම ඇහැරෙනකොටත් අසංක අයියා මගේ ළඟ හිටියා.

අයියේ අනුත්තර කතා කරාද?

නැහැ. එයාගෙ ෆෝන් එක ඕෆ් කරලා. අරුණිගෙනුත් උත්තරයක් නැහැ. අසංක අයියා කිව්වා. එයත් ඒ වෙලාවේ අවුලෙන් වගේ හිටියේ.

අනුත්තර ඇත්තටම අරුණිව බදියිද අයියේ.

මම දන්නෑ, ඔයා ඒ කොල්ලට දුන්න දුක් වල හැටියට එයා එහෙම කරන්නත් ඉඩ තියෙනවා.

එහෙම වුනොත් නම් මම මැරෙනවා.

කට වහගෙන ඉන්නවා. හැම වෙලේම මෝඩ වැඩ කරන එකමයි වැඩේ.

අයියා එහෙම කිව්වම් මම මොකුත් නොකියා කට වහගෙන හිටියා. තවත් ටික වෙලාවකින් අරුණියි අනුත්තරයි මම නොහිතපු විදිහට එතනට ආවා. අරුණි ස්සරියකුත් ඇදගෙනයි හිටියේ . ඒ දේන්නා අත් අල්ලගෙන හිටියේ. අත්වල මුදුත් තිබුනා.

මේක දැක්කට පස්සේ මට එකපාරටම ඇඩුනා. ඒ නිසා ඒ දෙන්නා ළගට එනකොට මම දනිස් දෙකෙන් ඔලුව තියාගත්තා. මට මේ දැම්ම කොහෙන් හරි පැනලා මැරෙන්න තිබුනානම් හිදයි කියලා හිතුනා.

අනුත්තර, ඒක ඇත්තක්ද? ඇත්තටම ඔයයි අරුණියි බැන්දද? අසංක අයියාඅ අහුවා.

ඔව්, මම අරුණිව බැන්දා. අනූට පුලුවන්නම් ඔයත් එක්ක සතුටින් ඉන්න මම වෙන මොනවා කරන්නද.

අනුත්තර එහෙම කියනකොට මට මං ගැනම ලොකු තරහක් ඇති වුනා. මම මේ මොකක්ද කරේ. මගේ මෝඩ කම හින්දා අයියට අරුණිවත් නැති වුනා. මගේ ඇස් වලින් කදුලු ගලාගෙන යද්දී මම ඔලුව උස්සන්නැතුව එහෙම්මම හිටියා. දැන්

ඉතින් මම මොනවා කරන්නද මොඩ කම කරේ මමමනේ.

අනුරාධා දැන් ඔයාට කොහොමද? අනුත්තර කිසිම ගානක් නැතුව එහෙම අහනකොට මට තවත් ඉඅවසන් ඉන්න බැරඉ උනා. එකපාරටම ඕලුව උස්සපු මම අතට ගහලා තිබුන සේලයින් බටේ ගලවලා විසි කරා. මගේ හොඳට හරි නැතුව හරි ඒ වෙලවේ මගේ බෙහෙත් දාන් ආපු ට්රේෙ එකේ බ්ලේඩ් එකක් තිබුනා. අනිත් තුන් දෙනා හිතන්නත් කලින් බ්ලේඩ් එක ගත්ත මම අත කපාගත්තා. අරුණියි අසංක අයියයි ඒ වෙලවේ මාව අල්ල ගත්තේ නැත්තම් මම මුලු අත දිගටම කපාගන්න තිබුනා. ඒ වෙලවේ අයාලට මාව පාලනය කරගන්න බැරි වෙන්න ඇති. අසංක අයියා මට ඉක්මනටම බෙහෙතක් විද්දා. ඊට පස්සෙ ටික වෙලාවකට ඇස් නිලන්කාර වෙලා ගියා.

ආයෙත් මම හරි සිහියට එනකොට අසංක අයියා මගේ අතට බෙහෙත් දාන් ගමන් හිටියේ. අනුත්තරගෙයි අරුණිගෙයි මූන දිහා මම නිකමටවත් බැලුවේ නැහැ.

අසංක අයියා බෙහෙත් දාලා ඉවර වෙනකම් මම දත්මිටි කාගෙන ඉවසගෙන හිටියේ.

මොකද අතේ තුවලේ රිදෙනවා වගේම හිතෙ තියෙන වේදනාවත් මම තනියමම විදගන්න එපැයි.

ඊට පස්සේ අනුත්තර මගේ ළඟින් ඉදගෙන මගේ අතින් අල්ල ගත්තා. මගේ අතට සීතලට දැනුන නිසා මම අමාරුවෙන් ඔලුව හරවලා බැලුවා.අනුත්තරත් අඩනවා.

ඇයි මෝඩියේ ඔය වගේ මෝඩ වැඩ කරන්නෙ. ඔයාට මගේ ගැන කිසිම ගානක් නැද්ද.

අනුත්තර ඔයා අරුණිව බැන්දනම් තවත් මොකටද අනු ගැන හොයන්නෙ. අසංක අයියා තරහින් වගේ ඇහුවා.

මට කතා කරන්න ඕනේ වුනත් කිසිම දෙයක් කියන්න  හිතාගන්න බැරි වුනා. අනුත්තරගේ මූන දිහා බලාගෙන අඩනවා ඇරෙන්න මට වෙන කරන්න දෙයක් තිබුනේ නැහැ.

අරුණි, අනුත්තරව එක්කන්  මෙතනින් යන්න. මම අමාරුවෙන් කිව්වා.

දැන් ඔයාට ඕනේ මාව එලවන්න්ද. ඇයි ඔහොම  හිත ගලක් කරගෙන ඉන්නේ. .

දැන් මට ඔයාට කියන්න කිසිම දෙයක් නැහැ. ඔයා අරුණිත් එක්ක සතිටින් ජීවත් වෙන්න. කොහොමත් මට ඕනේ උනේ ගිය ආත්මේ අරුණිට කරපු වැරැද්ද හරි ගස්සන්නනේ. දුකයි වුනත් මට වෙන කරන්න දෙයක් නැහැ. මම අඩන ගමින් කිව්වා.

ඇත්තද , ඔයාට කොහොමද දැන් මේ හැම දෙයක්ම එකපාරට මතක් වුනේ. මාව අතෑරලා ඔයා අසංකව බැන්දනම් ඇයි දැන් මේ මැරෙන්න හදන්නේ.

අනුත්තර එහෙම අහනකොට  මට දෙන්න උත්තරයක් තිබුනේ නැහැ.

මම අසංකව අයියව බැන්දේ නැහැ දෙයියනේ. එයා මගේ අයියා. මම ඔයාව අමතකයි වගේ හිටියේ ඔයාව මගෙන් ඈත් කරන්න ඕනේ නිසා. මම එහෙම කලේ කැන්සර් එකෙන් මම මැරෙයි කියලා හිතපු නිසා. මම අඩන ගමන්ම කිව්වා.

දැන් හැමදේම සිද්ධ වෙලා ඉවරයි අනූ. මම කිව්වා ඔයාට ඔය මෝඩ වැඩ කරන්න එපා කියලා. අන්තිමේට දැන් ඔයාගේ ජීවිතේ බේරගන්න

පුලුවන් වෙනකොට ඔයා ආදරේ කරපු කෙනා ඔයාට නැති වෙලා. අසංක අයියා කිව්වා.

මට හයියෙන් කෑගහලා අඩන්න ඕනේ වුනත් එහෙම කරන්න බැහනේ. මම ඉන්නේ ඉස්පිරිතාලෙකනේ. දවස් ගානක් තිස්සේ හිර කරන් හිටපු කඳුලු අනුත්තර ඉස්සරහා ඉදිද්දී තවත් හිර කරන් ඉන්න පුලුවන් වුනේ නැහැ. බිත්තියට ඔලුව තියාගෙන මම ඇස් දෙක වහගත්තේ අනුත්තරගේ මූන දිහා තවත් බලන් ඉන්න පුලුවන්කමක් නැති නිසයි.

ඒත් එකපාරටම අනුත්තර මාව එයාගේ ළ්ගට අරන් තුරුලු කරගත්තහම මට කිසිම දෙයක් හිතාගන්න බැරි වුනා. ඔයාගේ ඔය විකාර ගිය ආත්මේ අමතක කරන්න අනූ. දැන්වත් මගේ ආදරේ පිලිගන්න. ඇයි ඔයා ඔහොම බොරුවට විදවන්නේ.

මොකක්ද දැන් ඔයා කියන්න හදන්නේ අනුත්තර. අසංක අයියා ඇහුවා.

ඇත්තටම මම අරුණිව බැන්දේ නැහැ. අපි දෙන්නා එහෙම කිව්වේ අනූ ගේ කටින්ම ඇත්ත එළියට ගන්න. අපි දැනන් හිටියා අනූ බොරුවක් කරන්නේ කියලා. ඒත් මම හිතුවේ නැහැ

මේ මෝඩි අත කපා ගයි කියලා. මට එකපාරටම හිතාගන්න බැරි වුනා අත කපා ගත්තහම.

ඔය ඇත්තමද කියන්නේ. ඒ කියන්නේ ඔයා ඇත්තටම අරුණිව බන්දේ නැද්ද. මම අනුත්තරට ත්වත් තුරුල් වෙන ගමන් ඇහුවා.

ඔය ඉතින් මෝඩි ආයෙත් අඩනවා. මම ඔයාව අතැරලා අරිණිට කැමති වෙයි කියලා කොහොමද හිතුවේ. මට කතා කරන්නෙත් නැතුව හිටියා නේද ගිය දවස් ටිකේ. දැන් මොකද මේ පොඩි එකෙක් වගේ තුරුර්ල් වෙලා.

ආයේ නම් ඔයාව නැති කරගන්න බෑ. ඒකයි.

අම්මෝ එහෙනම් අනුත්තර අරුණිව බැදලා නැහැ. මම හිතුවා මේ පාර පටන් ගන්නත් කලින්ම ඉවර වුනා කියලා. අසංක අයියා කිව්වා.

මොකක්ද ඒ කතාවේ තේරුම. අරුණි ඇහුවා.

ඒ කතාවේ තේරුම තමයි මගේ මේ මෝඩ අසංක අයියා ඔයාට කැමතියි කියන එක. මම කිව්වා.

අනේ, හරි නුවණක්කාර වැඩ කරන කෙනානේ මේ තමන්ගේ අයියට මෝඩයා කියන්නේ. අරුණී කිව්වා.

මගේ අම්මේ, මේ බලමුකෝ අසංකට මෝඩයා කිව්වා කියලා මෙයාට තරහා ගිහිල්ලා. අනුත්තර කිව්වා.

ඒ කියන්නෙ මට බය වෙන්න දෙයක් නැහැ. අරුණී මට කැමතියි. අසංක අයියා කිව්වා.

# 17

තවත් සතියකට පස්සේ මට ගෙදර යන්න පුලුවන් වුනා. අනුත්තරත් මගේ ළගින් හිටපු නිසා මට මාසයක් විතර යනකොට හොද වුනා.

අරුණී අසංක අයියට කැමති වුන නිසා අරුණීගේ ප්‍ර ශ්නෙත් විසදුනා. එක දවසක් මමයි අනුත්තරයි හග්ගල ගාර්ඩ්න් එකට ගියේනිදහසේ කතා කරන්න.

ඇයි ඔයා එදා හමදේම අතෑරලා පැනලා ආවේ. අනුත්තර ඇහුවා.

මම හිතුවේ මම ගිය ආත්මේ කරපු දේට පලිගන්න ඔයා මට ළන් වෙන්න හදනවා කියලා.

අනේ මෝඩි,ඔයා ඔය ගිය ආත්මේ කතාවත් හරියට දන්නේ නැහැනේ.ඒ ආත්මෙත් ඔයාගේ මෝඩ වැඩ හින්දා තමයි අපි තුන්දෙනාම මැරුනේ.

මොකක්ද ඒ කතාවේ තේරුම.

ඔයා අරුණිව මරන්නේ මම කැමති අරුණිට කියලා හිතලනේ. ඒත් ඒ ආත්මෙත් මම ආදරේ කරේ ඔයාටයි. අරුණි මැරුනට පස්සේ මට මැසේජ් එක එන්නේ ඔයා ආදරේ කරන කෙනා සියදිවි නසාගෙන කියලනේ. එතකොට මම හිතන්නේ ඔයා මැරුනා කියලා.

ඒ නිසයි මමත් මැරෙන්නේ. අනිත් දේ තමයි මමයි අරුණියි කලින්ම මේ පෙර ආත්ම කතාව දන්නවා. ඒත් ඔයාට ඒක මතක් වෙන එක නවත්තන්නයි අරුණියි මයි මුල ඉදලම උත්සාහා කලේ. ඔයාට හීන පේනවා කියලා දනගත්තම මම අර ලාංජ්නේ ඔයාට ඇදලා එච්චෙත්ඔයාගේ මතකේ අවුල් වෙයි කියලා හිතලා. ඒත් කොහොමහරි අන්තිමේට ඔයාට ඔක්කොම මතක් වුනනේ.

ඒ මොකද ඔයා මට පෙර ආත්මේ මතක් වෙන එක නවත්තන්න හැදුවේ.

ඔයා ඉතින් මාව අතෑරලා දායි කියලයි එහෙම කරේ. දැන් දැක්කනේ ඉතින් ඔයා කරපු දේවල්.

මම එහෙම කරේ  කැන්සර් එකෙන් මැරෙයි කියලා හිතපු නිසා.ඔයාට ළං වෙලා මම මැරිලා ගියොත් ඒක ඔයාට කොච්චර දුකක්ද?

හැබැයි ඉතින් ඒකෙන් වුනේ අපි දෙන්නා ගොඩක් දුක් විඳපු එක විතරයි.

හ්ම්.... දැන් ඔය දේවල් වැඩක් නෑ. අපි දෙන්නා ආයෙත් කොහොමහරි එකතු වුනානේ.

අමතක වෙන්නේ නම් නෑ ලේසියෙන් ඔයාගේ මෝඩ වැඩ.

හරි හරි, එතකොට මේ නුවණක්කාරයා මට කියන්නකෝ ගිය මාස දෙකේ ඔෆිස් එකේ වැඩ වලට මොකද කරේ කියලා.

අනේ දෙවියනේ, මට ඔයා කියනකම්ම නිකමටවත් ඒ ගැන මතක් වුනේ නහැනේ.

එහෙනම් ඉතින් මේ පාර ඔයාට තාත්තාගෙන් බේරෙන්න බැරි වෙයි.

ප්රනශ්නයක් නෑ, එයාගේ ලේලිව දැක්කම ඕක අමතක වෙලා යයි.

මොකක්? ලේලි? මම කිව්වේ නැහැනේ ඔයාව බදිනවා කියලා. මම විඉග්ඉලුවට කිව්වා.

ආ..... එහෙමද , හා එහෙනම්, මම අරුණිව බදින්නම්. අනුත්තර කිව්වා.

ආ... එතකොට දැන් ඔයාට අරුණිව බදින්න මාර වුවමනවක් නේද තියෙන්නේ.

ඔව් ඉතින්, ඔයා මට කැමති නැත්තම් මම වෙන මොනවා කරන්නද?

ඔයාට හම්බුවෙයි අරුණිව. අසංක අයිය දෙයි මේන් කියල.

අනේ ඔයාගේ අසංක අයියා, ඔයා වගේම මෝඩඅය්එක් වෙන්න ඇති එයත්.

හා හා. මම මෝඩිද, ඔච්චර මොලේ තියෙන හින්දා වෙන්න ඇති මාස දෙකක් තිස්සේ ඔෆිස් එකේ වැඩ බලන්න තියෙනවා කියලා අමතක වුනේ.

ඒක මෙතෙන්ට අදාල නෑ හරිද, ඒක අමතක වීමක්. මෝඩකමයි ඒකයි අතරේ කිසි  සම්බන්ධයක් නැහැ.

ඔව් ඔව්, ඔයා වගේ මෝඩයෙක්ට කැමති වුන මම මෝඩියෙක්ම තමා.මම එහෙම කියලා ආතට දුවගෙන ගියා.

ඒයි මොකද්ද   කිව්වේ. ඔහොම ඉන්නව. මම අල්ලගන්නම්කෝ.

****නිමි****